# පහේ හපනුන්ට

# පරිසරයට අත්වැලක්

# 2020



අනුග්‍රහක දායකත්වය :-

Good Neighbors Sri Lanka

කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

## 5 ශ්‍රේණිය සිසු දරුවන්ට පරිසරය විෂයට අත්වැලක් ............

- මෙම කාර්ය පත්‍රිකා පොත පරිසර විෂයට අදාළව සිසුන්ට ප්‍රතිපෝෂණයක් ලබා දීම සඳහා භාවිත කරන්න.

- පන්තිභාර ගුරුවරයාගේ අභිමතය පරිදි සිසුන් සමඟ සාකච්ඡා කිරීමට හෝ පත්‍රිකා මුද්‍රණය කර ගෙන අභ්‍යාසයේ යොදවා හෝ ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සිදු කරන්න.

- සුදුසු පරිදි නැවත නැවත සාකච්ඡා කිරීම, අභ්‍යාසයේ යෙදවීම සඳහා කාලය යොදා ගන්න. මින් පසුවත් වාර්ෂිකව මෙය භාවිත කළ හැකි වේ.

- මෙම වර්ෂයේ සිට ඉදිරියට පරිසරය විෂයට අදාළ ප්‍රශ්නවලට වරණ 3 බැගින් ලබා දේ. මෙහි පසුගිය විභාග ප්‍රශ්න ද ඇතුළත් කොට ඇති බැවින් වරණ 4 සහිත ප්‍රශ්න ඇතුළත් ව තිබේ. නමුත් විභාගයේ දි වරණ 3 ක් පමණක් ලැබෙන බවට සිසුන් දැනුවත් කරන්න.

- කැබිතිගොල්ලෑව කලාපයේ ප්‍රාථමික අංශයේ සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා ඔබ ලබා දෙන දායකත්වය හා සහයෝගය අගය කොට සලකමි.

# පෙරවදනක්

උතුරුමැද පළාතේ පිහිටි කලාප අට අතරින් අති දුෂ්කර කලාපයක් වන කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයේ, ප්‍රාථමික අංශය සහිත සිංහල මාධ්‍ය පාසල් 98 ක් හා දමිළ මාධ්‍ය පාසල් 17 ක් පිහිටා තිබේ. ඒවායේ ඉගෙනුම ලබන සිසු දරු දැරියන් 2500 කට වැඩි සංඛ්‍යාවක් මෙවර ශිෂ්‍යත්ව විභාගය සඳහා අප කලාපයෙන් පෙනී සිටියි. ගුරු හිඟය, සීමිත භෞතික සම්පත්, සමාජ ආර්ථික ගැටලු සහිත පවුල් පරිසරයන් වැනි තත්ත්වයන් හමුවේ ගුණාත්මක අධ්‍යාපනයක් පවත්වාගෙන යාම සැබෑ අභියෝගකි. එම අභියෝගයන්ට හා හදිස්සි කොවිඩ් වසංගත තත්වය හමුවේ විෂය නිර්දේශ ආවරණය හා පෙර දැනුම පුනරීක්ෂණය කිරීම මගින් පරිසරය විෂය ආශ්‍රිතව ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා දායකත්වයක් සැපයීමේ අරමුණින් සැකසු මෙම පොත ඵලදායි ලෙස භාවිත කරමින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර ඔබ කරන කාර්යභාරය අගය කරමි. පොත මුද්‍රණය සඳහා මූල්‍ය අනුග්‍රහකත්වය ලබා දුන් ගුඩ් නේබර්ස් ආයතනයට ද මාගේ ස්තූතිය පිරිනමමි.

කුමුදිනි ආරියවංශ
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
කැබිතිගොල්ලෑව

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 1. අපේ යහපැවැත්ම

සැකසුම :- අනුෂමා දිසානායක
අ/ ඉහළතම්මැන්නෑව විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පොදු ස්ථානයක් නොවන්නේ මින් කුමක් ද?
   1. පාසල   2. නිවස   3. උසාවිය
2. හොඳ ළමයින් සමාන කරන්නේ මින් කුමන සතුන්ට ද?
   1. නරියන්ට   2. දළඹුවන්ට   3. සමනලයින්ට
3. සූර්ය නමස්කාරයේ අවස්ථා ගණන වන්නේ
   1. අටකි.   2. දොළහකි.   3. දහතුනකි.
4. කාලසටහනකට අනුව වැඩ කරන ළමයෙකුගේ දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ
   1. පාඩම් කිරීමට කාලයක් තිබීම.   2. පමා වී අවදි වීම.
   3. සෙල්ලම් කිරිමට වේලාව තිබීම.
5. යම් කාර්යයක් නියමිත කාලයක් තුළ ඉටු කිරීමෙන් අත්වන වාසිය වන්නේ
   1. කාර්යය සාර්ථක වීම.   2. කාර්යක්ෂමතාව වැඩි වීම.
   3. කාලය ඵලදායි ලෙස යොදා ගත හැකි වීම.
6. ගොවියකුගේ සාර්ථකත්වයට හේතු වන්නේ මින් කුමක් ද?
   1. වැසි කාලයට හේන එළි කිරිම.   2. පමා වී අස්වනු නෙළීම.
   3. නිසි කාලයට බීජ වැපිරීම.
7. පුස්තකාලයක් තුළ හැසිරීමේ දී වඩාත් ම වැදගත් වන්නේ
   1. නිහඬව සිටීම.   2. ලබා ගත් පොත් නියමිත ස්ථානයේ තැබීම.
   3. පුස්තකාලය තුළ ඇවිදීමෙන් වැළකීම.
8. මානසික හා කායික සුවපත් භාවය උදෙසා කරන ක්‍රියාකාරකම්වල පියවරවල් ගණන කොපමණ ද?
   1. හතරකි.   2. පහකි.   3. නවයකි.
9. මානසික හා කායික සුවපත් භාවය උදෙසා කරන ක්‍රියාකාරකම්වල පළමු පියවර කුමක් ද?
   1. මානසික ලිහිල් බව   2. ශාරීරික ලිහිල් බව   3. උදානය
10. මානසික හා කායික සුවපත් භාවය උදෙසා කරන ක්‍රියාකාරකම්වල තුන්වන පියවර වන්නේ
    1. අධිෂ්ඨානය   2. ප්‍රාර්ථනාව   3. මානසික ලිහිල් බව
11. මගේ පාසලට පන්තියට නිවසට මම ආලෝකයක් වෙනවාමයි. මෙය මානසික හා කායික සුවපත් භාවයේ කීවෙනි පියවර ද?
    1. පස්වන පියවර ය.   2. තුන්වෙනි පියවර ය.   3. දෙවන පියවර ය.
12. සැමගේ ම සිත් නිවේවා! මෙය මානසික හා කායික සුවපත් භවයේ
    1. තුන්වන පියවරයි.   2. හතරවන පියවරයි.   3. පස්වන පියවරයි.

13. මම මගේ නිවසට මිණි පහනක් වන්නෙමි. මෙය මානසික හා කායික සුවපත් භවයේ
   1. පස්වන පියවරයි. 2. පළමු පියවරයි. 3. තුන්වන පියවරයි.
14. දැන් සිත ද ලිහිල් බවට පත්කර ගනිමු. මෙය මානසික හා කායික සුවපත් භාවයේ
   1. තුන්වන පියවරයි. 2. දෙවන පියවරයි. 3. පස්වන පියවරයි.
15. අප නිතර ම ආහාරයට ගත යුත්තේ
   1. ක්ෂණික ආහාරයි. 2. ස්වභාවික ආහාරයි.
   3. තෙල් හා සීනි අධික ආහාරයි.
16. හැම විට ම අප තුළ ඇති කර ගත යුතු යහපත් චර්යාවකි.
   1. බයාදු චර්යා ය. 2. සහනශීලි චර්යා ය. 3. ආක්‍රමණශීලි චර්යා ය.
17. හොද දරුවෙක් ළඟ තිබිය නොහැකි ගුණයකි.
   1. පිරිසිදු ඇඳුම් ඇඳිම. 2. නිය කපා දැත් පිරිසිදුව තබා ගැනීම.
   3. අපිළිවෙළට පොත් තැබීම.

- පහත රූප වල දැක්වෙන්නේ සූර්ය නමස්කාරයේ කීවෙනි අවස්ථාව ද?

18. 
   1. පළමු අවස්ථාවයි.
   2. තුන්වන අවස්ථාවයි.
   3. දෙවන අවස්ථාවයි.

19. 
   1. පස්වන අවස්ථාවයි.
   2. හතරවන අවස්ථාවයි.
   3. දෙවන අවස්ථාවයි.

20. 
   1. හයවන අවස්ථාවයි.
   2. දොළොස්වන අවස්ථාවයි.
   3. නවවන අවස්ථාවයි.

21. 
   1. දෙවන අවස්ථාවයි.
   2. පස්වන අවස්ථාවයි.
   3. හයවන අවස්ථාවයි.

22. 
   1. පළමු වන අවස්ථාවයි.
   2. අටවන අවස්ථාවයි.
   3. තුන්වන අවස්ථාවයි.

23. 

1. හතරවන අවස්ථාවයි
2. එකොළොස්වන අවස්ථාවයි.
3. අටවන අවස්ථාවයි.

24. 

1. හතරවන අවස්ථාවයි
2. එකොළොස්වන අවස්ථාවයි.
3. දෙවන අවස්ථාවයි.

25. හොඳ පුරුදු අපේ ජීවිතයට එක් කර ගත යුත්තේ
1. පුංචි කාලයේ ය. 2. තරුණ කාලයේ ය. 3. වැඩිහිටි කාලයේ ය.

26. කුඩා දරුවෙකු ලෙස ඔබ නොකරන දෙය මින් කුමක් ද?
1. කොණ්ඩය පීරා ගැනීම. 2. ඇඳුම් ඇඳ ගැනීම. 3. ආහාර පිසීම.

27. මා නිසා මගේ යහළුවන් අපහසුතාවට පත්වන අවස්ථාවකි.
1. සංවර ව පන්තියේ හැසිරීම. 2. තමාට අවශ්‍ය දේ ළඟ තබා ගැනීම.
3. අධික ශබ්දයෙන් කතා කිරීම.

28. අප විසින් අත්හල යුතු චිරිතක් (අයහපත්) වන්නේ
1. වැඩිහිටියන් දුටු විට නැගිටීම. 2. කෑමට පෙර අත් සේදීම.
3. වැඩිහිටියන් සමඟ එකට එක කීම.

29. අවශ්‍ය පමණට ජලය පානය නොකිරීම නිසා
1. අධික තරබාරුව අඩු වේ. 2. සිරුර ප්‍රාණවත් වේ.
3. මූත්‍රාවල වර්ණය තද පැහැ වේ.

30. ශාරීරික යෝග්‍යතාව සඳහා
1. දිනපතා ම භාවනා කළ යුතු ය. 2. සූර්ය නමස්කාරය කළ යුතුය.
3. චිත්‍ර ඇඳිය යුතු ය.

31. කන්නාඩියෙන් පෙනෙන තමාගේ රූපයේ හොඳට ලස්සනට පිළිවෙළට තිබෙන දෙය වන්නේ මින් කුමක් ද
1. සපත්තුවල දූවිලි තැවරී තිබීම.
2. උදේ පීරූ කොණ්ඩය අවුල් නොවී තිබීම.
3. කමිසය පොඩි වී තිබීම.

32. පොදු ස්ථානවලදී අනුගමනය නොකළ යුතු දෙයකි.
1. මහ හඬින් දුරකථනයෙන් කතා කිරීම.
2. තම වාරය එනතුරු ඉවසිමෙන් බලා සිටීම.
3. යහපත් ලෙස හැසිරීම.

33. අප ජීවත් වීමේ දී තිබිය යුතු යහපත් ලක්ෂණයකි.
1. අන් මතවලට සවන් නොදීම. 2. සාමූහිකත්වයෙන් තොර වීම.
3. නීතිගරුක නොවීම. 4. ජය පරාජය එක සේ විඳ දරා ගැනීම.

34. අප නොසිටිය යුතු ආකාරයකි.
1. පිරිසිදු ව. 2. පිළිවෙළට 3. ලස්සනට 4. අපිළිවෙළට

35. යම්කිසි කාර්යයක් නියමිත කාලයක් තුළ සාර්ථක ව ඉටු කර ගැනීම සඳහා තිබිය යුතු දෙයකි.

1. කාලසටහන
2. දින පොත
3. හොඳ වැඩ පොත
4. දින දර්ශනය

36. සිරිමත් මගෙ සකි - යහපත් ළමයෙකි යන කවි පන්තිය රචනා කළේ,

1. එස්.මහින්ද හිමි.
2. සාගර පලන්සූරිය මහතා
3. කරුණාරත්න අබේසේකර මහතා
4. කුමාරතුංග මුනිදාස මහතා

37. යම්කිසි කාර්යයක් නිසි කාලය තුළ නිසි පරිදි ඉටු කිරීමෙන් ලැබෙන වාසි සම්බන්ධ සත්‍ය ප්‍රකාශය තෝරන්න.

1. සියලු දෙනාගේ ම නින්දාවට ලක් විම.
2. ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ නොදී සතුටින් සිටිමට හැකි විම.
3. සිතේ අසහනකාරී බව වැඩි වීම.
4. හොඳ හිත පලුදු විම.

38. යමක් ජයග්‍රණය කිරීමට නම් ඔබ තුළ තිබිය යුතු වැදගත් ලක්ෂණයකි.

1. නියමිත කාලයට වැඩ කිරීම.
2. කම්මැළිකමින් යුක්ත වීම.
3. කලබලයෙන් ඉක්මනින් වැඩ කිරීම.
4. වැඩ කරන අයට අවස්ථාව ලබා දී බලා සිටීම.

39. පොදු ස්ථාන ආරක්ෂා කිරීමට කළ යුතු දෙයකි.

1. පොදු ස්ථානවල කුණු කසළ දැමිම.
2. බිත්ති කුරුටු ගෑම.
3. අනවශ්‍ය දේවල් ඇලවීම.
4. කැඩී බිඳී ගිය කොටස් අලුත්වැඩියා කිරිම.

40. පුස්තකාලය තුළ දී මිනිසුන් විසින් කරනු ලබන වැරදි ක්‍රියාවකි

1. නිශ්ශබ්ද ව පොත්පත් කියවීම.
2. අන් අයට බාධා නොකිරිම.
3. පොත්වල කොටස් කපා රැගෙන යාම.
4. නියමිත ස්ථානයෙන් නැවත පොත තැබීම.

41. බස් නැවතුමේ දී මිනිසුන් කළ යුතු යහපත් ක්‍රියාවකි.

1. ආහාර දවටන දැමිම.
2. දැන්වීම් ඇලවීම.
3. අන් අයට බාධා නොවන ලෙස හැසිරීම.
4. චුයින්ගම් වැනි දේවල් ඇලවීම.

42. මහා මාර්ගය භාවිතා කිරිමේ දී කරනු ලබන වැරදි ක්‍රියාමාර්ගයකි,

1. රංචු වශයෙන් ගමන් නොකිරීම.
2. පයින් යන්නන් දකුණු පසින් යාම.
3. වේගයෙන් රිය නොපැදවීම.
4. පොත් කියවමින් පාරේ ගමන් කිරිම.

43. බැංකුවේ දී මිනිසුන් විසින් කරනු ලබන වැරදි හැසිරීමකි.

1. ආචාරශිලී ව කතා කිරිම.
2. තමාගේ අවස්ථාව එන තුරු බලා සිටීම.
3. බැංකුව තුළ පවතින නීති රීතිවලට අවනත ව කටයුතු කිරීම.
4. උස් හඬින් අන් අයට බාධා වන ලෙස කතා කිරීම.

44. පොදු වැසිකිළි භාවිතා කිරීමේ දී අනුගමනය කරනු ලබන වැරදි ක්‍රියාවකි.
   1. තමන්ගේ අවස්ථාව එන තුරු බලා සිටීම.
   2. වැසිකිළියේ පිරිසිදු බව රැක ගැනීම.
   3. යම් යම් දේවල් බිත්තිවල ලිවීම.
   4. පාවහන් භාවිතා කිරීම.

45. සූර්ය නමස්කාර ක්‍රියාකාරකම තුළින් බලාපොරොත්තු වන අරමුණක් නොවේ.
   1. සෞඛ්‍යමත් ජීවිතයක් ලබා ගැනීම.
   2. කාර්යශූර ජීවිතයකට හුරු කිරීම.
   3. ශරීරයේ උස ප්‍රමාණය වැඩි කිරීම.
   4. නම්‍යශීලී ජීවිතයකට හුරු කිරීම.

46. සූර්ය නමස්කාර ක්‍රියාකාරකම යොදා ගැනීමට සුදුසු ම අවස්ථාවකි.
   1. නිවාසාන්තර ක්‍රීඩා උත්සවය
   2. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ දී
   3. සතියේ සෑම සඳුදා දිනක ම
   4. ක්‍රියාකාරීව ප්‍රීතිමත් වෙමු වැඩ සටහන අවසානයේ දී

47. අධ්‍යාත්මික යෝග්‍යතාව සඳහා දිනපතා ජීවිතයට හුරු කර ගත යුතු ක්‍රියාකාරකමකි.
   1. සූර්ය නමස්කාරය
   2. සුවපත් වීමේ ක්‍රියාකාරකම්
   3. බයිසිකල් පැදීම
   4. මල් පූජා කිරීම.

48. සෑම නව විෂය කාලච්ජේදයක ම ආරම්භයේ දී සිදු කිරීමට සුදුසු වන්නේ සුවපත් වීමේ ක්‍රියාකාරකම්වල
   1. පළමු හා දෙවන පියවරයි.
   2. පළමු හා හතරවන පියවරයි.
   3. තුන්වන හා හතරවන පියවරයි.
   4. හතරවන හා පස්වන පියවරයි.

49. සුවපත් වීමේ ක්‍රියාකාරකම් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   1. ශාරීරික ලිහිල් බව, මානසික ලිහිල් ,අධිෂ්ඨානය, උදානය, ප්‍රාර්ථනාව
   2. මානසික ලිහිල් බව, ශාරීරික ලිහිල් බව, ප්‍රාර්ථනාව, අධිෂ්ඨානය
   3. ශාරීරික ලිහිල් බව, මානසික ලිහිල් බව, අධිෂ්ඨානය, ප්‍රාර්ථනාව, උදානය
   4. ප්‍රාර්ථනාව, උදානය, අධිෂ්ඨානය, මානසික ලිහිල් බව, ශාරීරික ලිහිල් බව

50. හුස්ම ඉහළට ගන්න පහළට හෙළන්න හුස්ම ගන්න යන ක්‍රියාකාරකම් ඇතුළත් වන්නේ
   1. ශාරීරික ලිහිල් බවේ දී ය.
   2. මානසික ලිහිල් බවේ දී ය.
   3. අධිෂ්ඨානයේ දී ය.
   4. ප්‍රාර්ථනාවේ දී ය.

51. මම අපගේ පවුලේ අයට නිවසට ගුණ ගරුක හොඳ දරුවකු වෙනවාමයි මම රටට දැයට වැඩදායි කෙනෙකු වෙනවා මයි යන සිතුවිලි ඇතිකර ගන්නේ
   1. මානසික ලිහිල් බවේ දී
   2. අධිෂ්ඨානයේ දී
   3. ප්‍රාර්ථනාවේ දී
   4. උදානයේ දී

52. සිත සන්සුන් වේවා සිත සැනසේවා සිතේ සන්සුන් බව රැදේවා සිතට සැනසුම උදා වේවා සිතුවිලි සුභද වේවා යන ප්‍රකාශ ඇතුළත් වන්නේ,
   1. මානසික ලිහිල් බවේ දී
   2. අධිෂ්ඨානයේ දී
   3. ප්‍රාර්ථනාවේ දී
   4. උදානයේ දී

53. මම මගේ පවුලේ අයට මිණි පහනක් වන්නෙමි.මම පහනක් වගේ ලෝකයට එළිය දෙන්නෙමි. යන සිතිවිලි ඇති වන්නේ

1. ශාරීරික ලිහිල් බවේ දී
2. අධිෂ්ඨානයේ දී
3. ප්‍රාර්ථනාවේ දී
4. උදානයේ දී

54. මගේ සිතේ නිවීමෙන් ලැබෙන සැනසිල්ල සතුන්ට ගස් වැල්වලට හැම දෙනෙකුට ම දැනේ වා සැමගේම සිත් නිවේ වා සැනසේවා යනුවෙන් පවසන්නේ

1. මානසික ලිහිල් බවේ දී
2. අධිෂ්ඨානයේ දී ය.
3. ප්‍රාර්ථනාවේ දී
4. උදානයේ දී

55. තමා විසින්ම කටයුතු සිදු කර ගැනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

1. අත්දැකීම් වැඩි වීම.
2. සිතට සතුටක් ඇති වීම.
3. ආත්ම විශ්වාසයක් ඇති වීම.
4. රෝගී වීම.

56. 5 ශ්‍රේණියේ දරුවෙකු ලෙස ඔබට තනිව ම කිරීමට නොහැකි ක්‍රියාවකි,

1. මුව සේදීම.
2. ඇඳුම් ඇඳීම.
3. සපත්තු දැමීම.
4. ආහාර පිසීම.

57. ආහාරයට ගැනීමට ඉතා සුදුසු දෙයකි.

1. තෙල් බේරෙන බැඳපු දේවල්
2. පැණි බේරෙන රතු බුංදි
3. පාට පාට අයිස් පැකට්
4. නිවුඩු හාලෙ බත්

58. පලා වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. තම්පලා, ගොටුකොළ, සාරණ, නිවිති
2. වට්ටක්කා, මුරුංගා කොළ, අගුණ කොළ, තම්පලා
3. කංකුං, ගොටු කොළ, කොහිල දළු, කැරට්
4. කැරට්, දිවුල්, ගොටු කොළ, කතුරු මුරුංගා

59. අපි ඕනෑ ම දෙයක් ආහාරයට ගත යුත්තේ

1. තනිවම යි.
2. යහළුවා සමග යි.
3. සියලු දෙනා සමග බෙදා හදා ගෙනයි.
4. සහෝදරයා සමග යි.

60. ''වෙරළු ගෙඩිය හරි අටකට කපා ගෙන..'' යන ගීතය ගායනා කරන්නේ

1. සුනිල් එදිරිසිංහ මහතා ය.
2. සුනිල් ශාන්ත මහතා ය.
3. රෝහණ වීරසිංහ මහතා ය.
4. මාලනී බුලත්සිංහල මහත්මිය ය.

61. දළඹුවාගේ විශේෂ ලක්ෂණයකි.

1. ලස්සන වීම.
2. පියැඹීමට හැකි වීම.
3. දුරගමන්වල යෙදීමට හැක.
4. ඇගේ ගැවුණුවිට පළු මතුවීම.

62. සිසුවකු ලෙස පිළිපැදිය යුතු කරුණකි.

1. පාසල පටන් ගැනීමෙන් පසුව පාසලට පැමිණීම.
2. විවේක කාලයට අවනත නොවීම.
3. විශේෂ නිවේදන වලට අවනතව කටයුතු කිරීම.

63. තමන් යහපත් දේ සිදු කිරීමෙන් නීති රීති සුරැකීමෙන් ලැබෙන ප්‍රයෝජන සම්බන්ධ අසත්‍ය ප්‍රකාශයකි

1. සිතට සතුටක් දැනීම.
2. ප්‍රශංසා හිමි වීම.
3. ජනප්‍රිය වීම.
4. සමච්චලයට ලක්වීම.

64. සිසුවකු ලෙස ඔබට ලැබෙන නායකත්වයක් නොවේ.

1. කණ්ඩායම් නායක 2. පන්ති නායක
3. ශිෂ්‍ය නායක 4. දේශපාලන නායක

65. ආදර්ශ පාඨයකි.

1. වැඩිහිටියන්ට උසුළු විසුළු කරමු.
2. පාසලට පැමිණීමේ දී රංචු වශයෙන් පැමිණෙමු.
3. ජාතික ගීයට ගරු කරමු.
4. පාසල අසුන්දර කරමු.

66. තරගයක් ජයග්‍රහණය කිරීමට නම් නොතිබිය යුතු ලක්ෂණයකි.

1. ඉවසීම. 2. කලබල වීම.
3. පවසන දේ නිවැරදිව අසාගෙන සිටීම 4. තරගකාරීත්වය

67. අපි ගසකින් ගෙඩියක් කඩන විට අනුගමනය කළයුතු හොඳ පුරුද්දකි .

1. අත්ත බිඳ දමා ගෙඩි කැඩීම.
2. ගෙඩි සියල්ලම කඩා ගැනීම.
3. අත්ත කොනේ එක ගෙඩියක් ගසටත් ඉතිරි කිරීම.
4. පැසීමට පෙර ගෙඩි කැඩීම.

68. අපි පාසලේ දී ගමන් කළ යුත්තේ

1. කලබලයෙන් 2. අන් අයගේ ඇඟේ හැපෙමින්
3. පේළියකට 4. දඟ කරමින්

69. අප විසින් ගුරුවරුන්ට කළයුතු දෙයකි.

1. ආයුබෝවන් කීම. 2. අකීකරු වීම.
3. ගුරුවරයා දුටු විට අසුනේ වාඩිවීම. 4. ගුරුවරයාව සතුටු නොකිරීම.

70. පාසල් එනවිට අප නොකළ යුතු දෙයකි.

1. උදෑසනම පැමිණීම. 2. පිරිසිදුව සැරසී ඒම.
3. මල් නෙළා බුදුන්ට පූජා කිරීම. 4. කලබලයෙන් පන්තියට ඒම.

71. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමෙහි පියවර ගණන වන්නේ,

1. 6 යි. 2. 5 යි. 3. 7 යි.

72. සූර්යය නමස්කාරයේ අවස්ථා ගණන වන්නේ,

1. 10 කි. 2. 12 කි. 3. 13 කි.

73. උපදේශනාත්මක කවි ඇතුළත් ග්‍රන්ථයකි.

1. සිරිත් මල්දම 2. ගුත්තිල කාව්‍යය 3.වෙසක් මිහිර

74. ක්ලාන්ත වූ රෝගියෙකුට නොකළ යුතු දෙයක් වන්නේ

1. හොඳින් වාතාශ්‍රය ලබාදීම. 2. පවන් සැලීම. 3. දියර වර්ග පෙවීම

75. මුත්‍රාවල වර්ණය තද පැහැති වීම ,සිරුරේ මලානික ගතිය, සම වියළීම .......... ආදිය ඇතිවන්නේ

1. ආහාර අඩුකම නිසා 2. වාතය නොලැබීම නිසා
3. ජලය අවශ්‍ය ප්‍රමාණයට පානය නොකරන නිසා.

76. හොඳ ළමයා කවි පන්තිය රචනා කරන ලද්දේ,

1. ආනන්ද සමරකෝන් මහතා 2. එස් මහින්ද හිමි.
3. මාර්ටින් වික්‍රමසිංහ මහතා

77. සිත් පහන් කිරිමේ ක්‍රියාකාරකමේ හතරවන පියවර වන්නේ

1. උදානය 2. ප්‍රාර්ථනාව 3. අධිෂ්ඨානය.

78. සන්සුන් සිතක් හා නිරෝගී ගතක් ඇතිවිමට කළ හැකි ක්‍රියාකාරකම වන්නේ,

1. පොත් කියවීම. 2. සමබල ආහාර ගැනීම.
3. සූර්යය නමස්කාරය

79. හොඳ හොඳ ළමයින් අපි වාගේ.. ගීතය ගායනා කරන්නේ,

1. නන්දා මාලනි මහත්මිය. 2. ඉන්ද්‍රාණි විජේබණ්ඩාර මහත්මිය.
3. ලතා වල්පොල මහත්මිය.

80. කෙනෙකු හැකියාවෙන් අගය කළ විට

1. ඔහු උදාසීන වේ. 2. ඔහු නොමඟ යයි.
3. ඔහු තම හැකියා වර්ධනය කර ගැනීමට උත්සාහ ගනියි.

81. මුළු ලෝකයම මට දිනන්න පුළුවන් මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමෙහි,

1. 3 වන පියවරයි. 2. 5 වන පියවරයි. 3. 4 වන පියවරයි.

82. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමෙහි තුන්වන පියවර වන්නේ,

1. අධිෂ්ඨානය 2. ප්‍රාර්ථනය 3. උදානය.

83. වට පිටාවට ඇහුම් කන්න දෙන්න. කුරුල්ලන්ගේ හඬ මට හොදින් ඇසෙයි..... මෙය අයත් වන්නේ සිත් පහන් කිරිමේ කුමන පියවරට ද?.

1. ශාරිරික ලිහිල් බව 2. ප්‍රාර්ථනය 3. මානසික ලිහිල් බව

84. යහ පුරුද්දක් වන්නේ

1. වැඩිහිටියන් සමඟ එකට එක කීම. 2. ශබ්ද නගමින් ආහාර ගැනීම.
3. කෑමට පෙර අත් සේදීම.

85. ඔබ අපහසුතාවයට පත්වන අවස්ථාවක් වන්නේ,

1. බස්රිය තුළදී අධික ශබ්දයෙන් යුතුව කැසට් යන්ත්‍රය ක්‍රියා කර තිබිමේ දී
2. සංවරව හා හඬ අඩුවෙන් කතා කිරීමේ දී
3. පාර මාරුවිමේ දි කහ ඉර (පදික මාරුව) භාවිත කිරිමේ දී

86. අපේ සමාජය තුළ ඇති සිරිතක් නොවන්නේ,

1. නැකතට අකුරු කියවීම. 2. ලිප ගිනි මෙලවීම.
3. රංචු ගැසි පාරේ ගමන් කිරිම.

87. සංකිර්ණ දේවල් ජීවිතයට යොදා ගැනීමෙන්,

1. ජීවිතය යහපත් වේ. 2. මිල මුදල් ඉතිරි වේ.
3. ජීවිතය විනාශය කරා ළඟා වේ.

88. සරල දිවි පැවැත්මක ඇති වාසියක් වන්නේ,

1. විවිධ විලාසිතාවලට හුරුවීම.
2. ලද දෙයින් සතුටු වෙමින් සැහැල්ලු ජීවිතයක් ගත කිරීම.
3. මුදල් අධික ලෙස වැයවිම.

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 2. අපි ලක්වැසියෝ |
|---|---|---|

සැකසුම :- ඩබ්.එම්.එස්.එස්.කේ. වීරකෝන්
අ/ දැකැතිපොතාන විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු වර්ෂය වන්නේ,
   1. 1972 2. 1948 3. 1996
2. සියලුම ජනවර්ග එකතු වී සමරන ජාතික උත්සවයකි,
   1. නිදහස් උත්සවය 2. අවුරුදු උත්සවය 3.නත්තල් උත්සවය
3. දන්සල් පවත්වා ජනතාවට සංග්‍රහ කරන උත්සවයකට සම්බන්ධ ජාතිය වන්නේ ,
   1. සිංහල 2. මුස්ලිම් 3. බර්ගර්
4. නිදහස් අධ්‍යාපනයේ පියා වන්නේ,
   1. ඩී.එස්.සේනානායක මහතා 2. අනගාරික ධර්මපාල තුමා
   3. සී.ඩබලිව්.ඩබලිව්.කන්නන්ගර මහතා
5. ජාතික ගීයේ නිර්මාතෘ වන්නේ,
   1. ඕල්කට් තුමා 2. අනගාරික ධර්මපාල තුමා
   3. ආනන්ද සමරකෝන් මහතා
6. තෝසේ,සාම්බාරු ... ආදි ආහාර වර්ග ප්‍රධාන කරගත් ජාතිය වන්නේ,
   1. මුස්ලිම් 2. දමිළ 3. ආදි වාසින්
7. මුස්ලිම් කාන්තාවන්ගේ හිස්වැසුම හඳුන්වන්නේ,
   1. බාපනය 2. සුම්බරේ 3. ඉජාහාප්
8. මාසයක් පුරා පැවැත්වෙන උපවාසය අවසන් කිරීමට පවත්වන උත්සවය වන්නේ,
   1. රාමසාන් උත්සවය 2. දීපවාලි උත්සවය 3. වෙසක් උත්සවය
9. මුස්ලිම් ජාතික කාන්තාවන් අඳින ඇඳුම වන්නේ,
   1. හබාය 2. ජුම්මා 3. ඉජාහාප්
10. ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යාවක් නියෝජනය කරන ජාතිය වන්නේ,
    1. සිංහල 2. දමිළ 3. මුස්ලිම්
11. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කටයුතු කල ජන නායකයෙකි,
    1. අනගාරික ධර්මපාල තුමා 2. ආතර් වී. දියෙස් මහතා 3. ආතර් සී.ක්ලාක්
12. ශ්‍රී ලංකාවේ ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ වන්නේ,
    1. මොරටුව 2. පිළිමතලාව 3. ඇම්බැක්කේ දේවාලය
13. මනස වෙහෙසා කරන ක්‍රීඩාවක් වන්නේ,
    1. ගුඩු පැනීම 2. කැරම් ගැසීම 3. චෙස් ඇදීම
14. බර්ගර් ජාතියෙහි ප්‍රියතම ආහාර වර්ගයකි,
    1. තෝසේ 2. සාම්බාරු 3. කේක්
15. ඉස්ලාම් ආගමික ස්ථානය හඳුන්වන්නේ,
    1. පල්ලිය 2. කෝවිල 3. මස්ජිදය

16. "භගවත් ගීතාව" නැමති ආගමික ග්‍රන්ථය ප්‍රධාන කොටගත් ජාතිය,
   1. සිංහල   2. දමිළ   3. මුස්ලිම්
17. බෞද්ධයන්ගේ අත්පොත ලෙස සැලකෙන්නේ,
   1. පන්සිය පනස් ජාතක පොත   2. ත්‍රිපිටකය   3. ධම්මපදය
18. හින්දු භක්තිකයන් ශිව දෙවියන් උදෙසා පවත්වන උත්සවය වන්නේ.
   1. තෛපොංගල්   2. මහ සිකුරාදා   3. මහා ශිව රාත්‍රිය
19. "අහසින් වැටෙනා එක දිය බිඳක් වත් ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොදෙන්නැයි"ප්‍රකාශය කළ රජතුමා වන්නේ,
   1. මහසෙන් රජතුමා   2. ධාතුසේන රජතුමා   3. පරාක්‍රමබාහු රජතුමා
20. අලුත් සහලින් හිරු දෙවියන් පුදන හින්දු ආගමික උත්සවය වන්නේ,
   1. මහා ශිව රාත්‍රිය   2. රාමසාන් උත්සවය   3. තෛපොංගල් උත්සවය
21. ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට කීර්තියක් ගෙන දුන්නේ,
   1. පණ්ඩිත් අමරදේව ශූරීන්   2. නීලා වික්‍රමසිංහ   3. සුසන්තිකා ජයසිංහ
22. කුරුලු පාරාදීසය පිහිටා ඇත්තේ,
   1. පින්නවල   2. කුමන ප්‍රදේශයේ   3. දෙහිවල
23. ශ්‍රී ලංකාවට විශිෂ්ට සේවාවන් කළ ඉහත සඳහන් පුද්ගලයින්ගේ නම් පිළිවෙළින් ඇති පිළිතුරු වන්නේ,

1. 
2. 
3. 
4. 

   1. අනගාරික ධර්මපාල තුමා, එස් මහින්ද හිමි, ටී.බී. ජයාමහතා, ආතර් සී ක්ලාක් මහතා
   2. ටී.බී.ජයා මහතා, එස්. මහින්ද හිමි, ආතර් සී ක්ලාක් මහතා, අනගාරික ධර්මපාල තුමා,
   3. ආතර් සී ක්ලාක් මහතා, එස්. මහින්ද හිමි, අනාගාරික ධර්මපාල තුමා, ටී.බී. ජයා මහතා
24. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කටයුතු කළ පින්තූරයේ සඳහන් නායකයා වන්නේ,



   1. අනගාරික ධර්මපාල තුමා
   2. ටී.බී.ජයා මහතා
   3. ආනන්ද කුමාරස්වාමි මහතා
25. ආදි වාසීන් ජීවත් වන ප්‍රදේශයකි,
   1. දඹාන   2. වාරියපොළ   3. මින්නේරිය
26. මී පැණි සහ දඩමස් වලට ප්‍රසිද්ධ ජනවර්ගය වන්නේ,
   1. සිංහල   2. දමිළ   3. ආදි වාසීන්
27. රූකඩ කලාවට ප්‍රසිද්ධ නගරය වන්නේ,
   1. අම්බලන්ගොඩ   2. සීගිරිය   3. පිළිමතලාව
28. ''යුද්දෙටත් ඇවිත් සිදු පිට නැව් නැගීලා"යනු,
   1. ජන කවි වලින් උපුටා ගන්නා ලද්දකි.
   2. පැරණි හටන් කවි වලින් උපුටා ගන්නා ලද්දකි.
   3. ඔන්චිලි වාරමකි.

29. ජාතික කොඩියෙහි ජාතික අභිමානය නිරූපනය කරන්නේ,
   1. කහ පැහැති සිංහ රූපයෙනි.   2. රතු පැහැති පසු බිමෙනි.
   3. බෝ කොළ හතරෙනි.
30. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ගණනක් අයත් පළාත වන්නේ,
   1. උතුරුමැද පළාත   2. උතුරු පළාත   3. නැගෙනහිර පළාත
31. වෙස් මුහුණු හා ලී බඩු කර්මාන්තය සඳහා අප රටේ ප්‍රසිද්ධ නගර දෙක වන්නේ,
   1. දුම්බර, මහනුවර   2. අම්බලන්ගොඩ, මොරටුව
   3. දුම්බර, කෑගල්ල
32. ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි රටක් වන්නේ,
   1. ඉන්දියාව   2. කැනඩාව   3. ජපානය
33. අපේ රටේ රාජ්‍ය ලාංඡනයේ දැකිය නොහැකි සංකේතයක් වන්නේ.
   1. ධර්ම චක්‍රය   2. ඉර හඳ   3. බෝපත්
34. ශ්‍රී ලංකා රාජ්‍ය  ලාංඡනයේ ඇති පුන්කලසෙන් අදහස් කරන්නේ,
   1. සෞභාග්‍යයි.   2. ස්වයංපෝෂිත බවයි.   3. සදාකාලික පැවත්ම
35. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනු,
   1. රාජ්‍ය නොවන ආයතනයකි.   2. පෞද්ගලික ආයතනයකි.
   3. රාජ්‍ය ආයතනයකි.
36. හින්දු භක්තිකයන් විසින් සමරන උත්සවයක් නොවන්නේ,
   1. තෛපොංගල්   2. මහා ශිව රාත්‍රිය   3. රාමසාන්
37. නැගෙනහිර පළාතට අයත් නොවන දිස්ත්‍රික්කයක් වන්නේ.
   1. ත්‍රිකුණාමලය   2. මඩකලපුව   3. මුලතිව්
38. මෑතකදී අප අතරින් සමුගත් මහා ගාන්ධර්වයා ලෙස ලක්වාසින් අතර ජනාදරයට පත් පහත රූපයෙහි සඳහන් වන්නේ,



   1. ප්‍රේමසිරි කේමදාස මහතා
   2. පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේව මහතා
   3. මාර්ටින් වික්‍රමසිංහ මහතා
39. ශ්‍රී ලාංකික ජනතාව විසින් නිදහස් දිනය සමරනු ලබන්නේ,
   1. මැයි 01 වෙනිදාය.   2. ජූනි 05 වෙනිදාය.   3. පෙබරවාරි 04 වෙනිදාය.
40. අපේ රටේ ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය පිළිවෙළින් දැක්වෙන්නේ,
   1. මානෙල්, නා   2. නා, මානෙල්   3. රුක්, නා
41. කැරොල් ගීත ගායනා කරන්නේ,
   1. හින්දු බැතිමතුන් ය.   2. මුස්ලිම් බැතිමතුන් ය.   3. ක්‍රිස්තියානි බැතිමතුන් ය.
42. සිංහලයන්ගේ ජාතිකාභිමානය ජනිත වන කාව්‍ය නිර්මාණය කළේ,
   1. පියදාස සිරිසේන මහතා   2. මාර්ටින් වික්‍රමසිංහ මහතා   3. එස්.මහින්ද හිමි
43. මෙම රූපයේ දැක්වෙන ජාතික වීරයා වන්නේ,



   1. මොනරවිල කැප්පටිපොළ
   2. අනගාරික ධර්මපාල තුමා
   3. ගොංගාලේ ගොඩ බණ්ඩා

44. රත්නදීප ජන්ම භූමි..... ගීතය,
1. දරුනැළවිලි ගීතයකි. 2. බොදු ගුණ ගීතයකි. 3. දේශාභිමානී ගීතයකි.

45. රාජ්‍ය ලාංඡනයේ ඉහළින්ම ඇත්තේ,
1. වී කරල් 2. ඉරහඳ 3. ධර්මචක්‍රය

46. ''අස්ලාම් අලෛකුම්'' යන වචනය භාවිතා කර ආචාර කරන ජාතිය වන්නේ,
1. හින්දු 2. මැලේ 3. මුස්ලිම්

47. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1. ඩී.එස්.සේනානායක මහතා
2. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
3. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මහතා

48. ගවලෙනක ආකෘතින් සාදන ආගමික උත්සවයකි,
1. දීපවාලි 2. මහාශිව රාත්‍රිය 3. නත්තල්

49. හින්දු ආගමිකයන්ට අයත් ආගමික සැරසිල්ලකි.
1. වෙසක් කූඩු 2. කෝලම් රටා 3. සීල් මුද්‍රන

50. ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් පිහිටන පළාතකි,
1. සබරගමු පළාත 2. මධ්‍යම පළාත
3. ඌව පළාත 4. වයඹ පළාත

51. ශ්‍රී ලංකාවට වඩාත් ආසන්නව පිහිටා ඇති රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මාල දිවයින, නේපාලය, භූතානය
2. පාකිස්තානය, ජපානය, බංග්ලාදේශය
3. ඉන්දියාව, පාකිස්ථානය, බ්‍රිතාන්‍ය

52. ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසල් ශිෂ්‍ය, ශිෂ්‍යාවකටම නොමිලේ රජයෙන් ලබා දෙන්නේ,
1. නිල ඇඳුම්හා දිවා ආහාරය 2. දිවා ආහාරය හා පෙළපොත්ය
3. පෙළපොත් හා නිල ඇඳුම් ය. 4. ශිෂ්‍යාධාර හා දිවා ආහාරය

53. කුරුටු ගී හා බිතු සිතුවම් දක්නට ලැබෙන ඓතිහාසික ස්ථානයකි,
1. සීගිරිය 2. යාපහුව 3. ඉසුරුමුණිය 4. ඇම්බැක්ක

54. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් වලිකුකුළා තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ,
1. මෙරට බහුලව සිටීමය 2. මෙරටට ආවේණික වීම ය.
3. සෑම ප්‍රදේශයකම දක්නට ලැබීමය 4. වඩාත් ප්‍රයෝජනවත් වීම ය.

55. අතීතයේ දී අප රට යටත් කරගෙන සිටි විදේශීය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. පෘතුගීසින්, ලන්දේසීන්, ඉංග්‍රීසීන් 2. ලන්දේසීන්, පෘතුගීසින්, ඉංග්‍රීසීන්
3. ඉංග්‍රීසීන්, පෘතුගීසින්, ලන්දේසීන් 4. පෘතුගීසින්, ඉංග්‍රීසීන්, ලන්දේසීන්

56. කැටයම් කරන ලද සත්ත්ව පේළි ද සහිත විශිෂ්ට කලා නිර්මාණයකි,
1. සෙල්ලිපිය 2. සඳකඩ පහන 3. පුන්කලස 4. පුරාවිද්‍යා ලංඡනය

57. ශ්‍රී ලංකාවේ පිහිටි පූජනීය නොවන ඓතිහාසික ස්ථානයකි,
1. රුවන්වැලිසෑය 2. ගාලු කොටුව 3. ශ්‍රී පාදය 4. ථූපාරාමය

58. ශ්‍රී ලංකාවට නැගෙනහිරින් පිහිටා ඇති රටකි,
1. මැලේසියාව 2. ඉන්දියාව 3. එංගලන්තය 4. ග්‍රීසිය
59. ප්‍රසිද්ධ ලේඛකයකු ලෙස හා තාරකා විද්‍යාඥයකු ලෙස ලෝකයට විශිෂ්ට සේවාවක් සිදු කළ අයෙකි,
1. ශ්‍රීමත් ආතර් සී ක්ලාක් මහතා 2. ශ්‍රීමත් ඩී.බී.ජයතිලක මහතා
3. ආචාර්ය ටී.බී.ජයා මහතා 4. ආචාර්ය ආනන්ද කුමාරස්වාමී
60. ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ඔලිම්පික් පදක්කමක් හිමිකර දුන්නේ කවු ද?
1. සුසන්තිකා ජයසිංහ 2. ඩන්කන් වයිට්
3. ජුලියන් බෝලිං 4. දීපිකා චන්මුගම්
61. මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානයට ආසන්නම නගරය කුමක් ද?
1. ත්‍රිකුණාමලය 2. මඩකලපුව 3. මුලතිව් 4. පුත්තලම
62. ලී කැටයම්වලට ප්‍රසිද්ධ ස්ථානයකි,
1. යාපහුව බල කොටුව 2. ලෝවාමහපාය
3. ඇම්බැක්ක දේවාලය 4. ඉසුරුමුණි විහාරය
63. සියළුම ආගමික බැතිමතුන් වැඳ පුදාගන්නා ශ්‍රී පාද ස්ථානය පිහිටි පළාත කුමක් ද?
1. ඌව පළාත 2. නැගෙනහිර පළාත 3. මධ්‍යම පළාත 4.සබරගමුව පළාත
64. ශ්‍රී ලංකික ජනතාව විසින් නිදහස් දිනය සමරනු ලබන්නේ,
1. ජනවාරි 01 වැනිදාය. 2. පෙබරවාරි 04 වැනිදාය
3. අප්‍රේල් 13 වැනිදා ය. 4. මැයි 01 වැනි දා ය.
65. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ සහ රාජ්‍ය ලාංඡනයේ යන දෙකෙහිම ඇති සංකේතය කුමක් ද?
1. පලාපෙති 2. පුන්කලස 3. බෝපත් 4. කඩුව රැගත් සිංහයා
66. ඔලිම්පික් කොඩියේ ඇති රවුම්වල වර්ණ තුනක් සහිත පිළිතුර තෝරන්න.
1. රතු, නිල්, කහ 2. රතු, කළු, දම්, 3. කළු, කොළ, දුඹුරු 4. නිල්, සුදු, රතු
67. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන්නේ,
1. කොවුලා 2. ගිරවා ය 3. වලිකුකුළාය 4. පරෙවියා ය
68. ඔලිම්පික් කොඩියේ එකිනෙකට සම්බන්ධ වූ රවුම් ගණන කීය ද?
1. දෙකකි 2. තුනකි 3. හතරකි 4. පහකි
69. කතරගම පූජනීය නගරය අයත් වන්නේ,
1. දකුණු පළාතටය 2. සබරගමු පළාතටය
3. නැගෙනහිර පළාතටය 4. ඌව පළාතටය
70. මින්නේරිය වැව කරවන ලද්දේ ,
1. මහසෙන් රජතුමා 2. ධාතුසේන රජතුමා
3. දේවානම්පියතිස්ස රජතුමා 4. දුටුගැමුණු රජතුමා
71. ''නිදහස් අධ්‍යාපනයේ පියා'' යන විරුදාවලිය ලබන්නේ,
1. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහතා
2. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
3. ආචාර්ය සී ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා
4. ආචාර්ය ටී.බී. ජයා මහතා
72. ඓතිහාසික වටිනාකමින් යුත් පූජනීය නගරයකි,
1. අනුරාධපුරය 2. නුවරඑළිය 3. සීගිරිය 4. වවුනියාව

73. ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි රටක් වන්නේ,
1. සෞදි අරාබිය 2. ජපානය 3. ඉන්දියාවය 4. කැනඩාව
74. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පිහිටා ඇත්තේ,
1. කටුනායක 2. මත්තලය 3. රත්මලානේය 4. වීරවිලය
75. ශ්‍රී ලංකාව් සත්ත්ව පාලනය සහිතව කිරි නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් පිහිටි ප්‍රදේශය වන්නේ,
1. වැලිසරය 2. මහ ඉලුප්පල්ලමය 3. හංවැල්ලය 4. අඹේවෙලය
76. දේවානම්පියතිස්ස රජතුමා විසින් තනවන ලද්දේ,
1. තිසා වැව 2. යෝධ වැව 3. කන්තලේ වැව 4. මහකනදරා වැව
77. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ දක්නට ලැබෙන සංකේතයකි,
1. බෝපත් ය 2. හංසයා ය. 3. ඉරය 4. නාගයා ය.
78. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගි මහා මාර්ගය කුමක් ද?
1. උතුරු අධිවේගී මහා මාර්ගය 2. දක්ෂිණ අධිවේගි මහා මාර්ගය
3. කටුනායක අධිවේගි මහා මාර්ගය 4. කොළඹ-නුවර අධිවේගී මහා මාර්ගය
79. වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ශ්‍රී ලංකාව ඉන්දියාවට දකුණින් පිහිටා ඇත.
2. ශ්‍රී ලංකාව අයත් වන්නේ අප්‍රිකා මහද්වීපයට ය.
3. ශ්‍රී ලංකාව කඳුළක හැඩය ගත් දූපතකි.
4. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇත.
80. දකුණු පළාතට අයත් නගරයක් වන්නේ,
1. කළුතර 2. බලන්ගොඩ ය. 3. අම්බන්ගොඩ ය 4. මොනරාගල ය.
81. කොළඹ සිට බදුල්ල දක්වා වැටී ඇති දුම්රිය මාර්ගයේ හමුවන දුම්රිය නැවතුම්පොළකි,
1. වටවල 2. හබරණ 3. සීදුව 4. වව්නියාව
82. ධාතුසේන රජතුමා විසින් කරවන ලද වැවකි,
1. කලාවැව 2. අභය වැව 3. මින්නේරිය වැව 4. ගිරිතලේ වැව
83. ශ්‍රී ලංකාවේ උසම දිය ඇල්ල වන්නේ,
1. බඹර කන්ද ය 2. දියලුම ය 3. ලක්ෂපාන ය 4. දුන්හිඳ ය
84. කොළඹ මෝදර ප්‍රදේශයෙන් මුහුදට වැටෙන්නේ,
1. මහවැලි ගඟය 2. කැලණි ගඟය 3. කළු ගඟය 4. වලවේ ගඟය
85. අභය (බසවක්කුලම) වැව කරවන ලද්දේ,
1. පණ්ඩුකාභය රජතුමා විසිනි 2. දේවානම්පියතිස්ස රජතුමා විසිනි.
3. ධාතුසේන රජතුමා විසිනි 4. මහසෙන් රජතුමා විසිනි.
86. උඩරට ගිවිසුම අත්සන් කළ වර්ෂය වන්නේ,
1. 1948 2. 1815 3. 1505

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 3. පැළෑටි හා ගස්වැල් |
|---|---|---|

සැකසුම :- මහේෂ් ධර්මදාස
අ/ කපුගොල්ලෑව ප්‍රාථමික විදුහල

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පහත දැක්වෙන මල් වර්ග අතුරෙන් වඩාත් ම සුවඳ හමන මල් වර්ගය වන්නේ,

(1) ඉද්ද ය. (2) වතුසුද්ද ය. (3) පිච්ච ය.

02. සියඹලා ශාකයේ පත්‍රවල හැඩයට සමාන හැඩයක් සහිත ශාක පත්‍ර ඇති ශාකය වන්නේ,

(1) කතුරුමුරුංගා ය. (2) මුගුණුවැන්න ය. (3) නිදිකුම්බා ය.

03. කඳෙහි ගෙඩි හටගන්නා ශාකයන් වන්නේ,

(1) බිලිං ය. (2) ලොවි ය. (3) මැංගුස් ය.

04. හිරු එළිය හොඳින් වැටෙන ස්ථානයක ගසක අත්තක් පරීක්ෂණයක් සඳහා පොලිතින් බෑගයකින් ආවරණය කර ගැට ගසා තබන ලදී. පැයකට පමණ පසු නිරීක්ෂණය කළ විට දක්නට ලැබුණේ,

(1) පත්‍ර යන්තමින් කහ පැහැ ගැන්වී ඇති බව ය.

(2) පත්‍රව මැලවී ඇති බව ය.

(3) බෑගය ඇතුළත කුඩා ජල බිංදු තැන්පත් වී ඇති බව ය.

05. දිගැටි පත්‍ර සහිත ශාකයක් නොවන්නේ,

(1) පොල් (2) රම්පේ (3) කොට්ටම්බා

06. පහත දැක්වෙන මල් වර්ග අතුරෙන් සවස පිපෙන මල් වර්ගය වන්නේ,

(1) වතුසුද්ද ය. (2) කුමුදු ය. (3) හෙන්දිරික්කා ය.

07. මල්වලට හානි කරන සතෙකු වන්නේ,

(1) මෙරුවා ය. (2) බඹරා ය. (3) කුරුමිණියා ය.

08. මල බැඳුනු ඇණයක් පාදයක ඇනුණු අයෙකුට නොපමාව බීමට දිය යුතු සුදුසු ඖෂධීය ශාකය වන්නේ,

(1) කොත්තමල්ලි (2) වෙනිවැල්ගැට (3) රණවරා මල්

09. ගෙවත්තේ බෝග වගාවට හානි කරනු ලබන කෘමීන්ගේ පැමිණීම වළක්වාලීමට වගා කරන ශාකයක් වන්නේ,

(1) ගඳපාන ය. (2) පැඟිරි ය. (3) දහස්පෙතියා ය.

10. කැඳ සෑදීම සඳහා ගන්නා කොළ වර්ගයක් නොවන්නේ,

(1) කෝප්පප කොළ ය. (2) යකිනාරං කොළ ය. (3) එළබටු කොළ ය.

11. අවුරුද්ද පුරාම මල් පිපෙන ශාකයකි.

(1) ඇහැළ (2) එරබදු (3) අරලිය

12. ජලජ ශාකයකි.

(1) ගිරිතිල්ල (2) මීවන (3) හයිඩ්‍රිල්ලා

13. අඹ, ගම්මාලු, පොල් යන බීජ වර්ග ව්‍යාප්ත වන්නේ පිළිවෙළින්,
(1) සුළඟ, ජලය හා සතුන් මඟිනි. (2) ජලය, සුළඟ හා සතුන් මඟිනි.
(3) සතුන්, සුළඟ හා ජලය මඟිනි.

14. ශාක පත්‍ර උපයෝගී කරගෙන තම නිවහන සාදා ගන්නේ,

(1) කොකා ය. (2) දිමියා ය. (3) ලේනා ය.

15. අතු කැබලි සිටුවීමෙන් පැළ ලබා ගත හැකි බෝග වර්ගය කුමක් ද?

(1) මිරිස් (2) කංකුං (3) අර්තාපල්

16. ශ්‍රී ලංකාවේ ඒක දේශික ශාකයක් වන්නේ,

(1) අඹ ය. (2) දෙළුම් ය. (3)ගොඩපර ය.

17. ශාකයකට මල්වලින් ඇති ප්‍රයෝජනය වන්නේ,
(1) අලංකාරය ලබා දීම ය. (2) සුවඳ පැතිරවීම ය.
(3) තම වර්ගය බෝ කිරීමට උපකාරී වීම ය.

18. සුළඟින් ව්‍යාප්ත වන බීජ පමණක් අඩංගු පිළිතුර වන්නේ,
(1) තොටිල, වරා, මොණරකුඩුම්බිය ය.
(2) තොටිල, කජු, හොර ය.
(3) නාගදරණ, වරා, මොණරකුඩුම්බිය ය.

19. රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණයක් වන්නේ,
(1) නොමේරූ බීජයක් වීම ය.
(2) පිටපොත්ත පැල්ලම් රහිත ව දීප්තිමත් වීම ය.
(3) බීජය අවපැහැ වීම ය.

20. පෙති හතරක් ඇති මලකට උදාහරණයක් වන්නේ,

(1) ඉද්ද ය. (2) සේපාලිකා ය. (3) රත්මල් ය.

21. ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයන් නොවන්නේ මින් කුමක් ද?

(1) හීන් බෝවිටියා (2) හාතාවාරිය (3) හොර

22. සතුන් මඟින් පමණක් ව්‍යාප්ත වන ශාක අඩංගු පිළිතුර තෝරන්න.
(1) රබර්, ඇහැළ, කඳුරු (2) කජු, නාගදරණ, තුත්තිරි
(3) මදටිය, කුඩලු, තුත්තිරි

23. වගාවලට හානි කරන සත්ව විශේෂයක් නොවන්නේ,

(1) පැළමැක්කා ය. (2) බත්කූරා ය. (3) පුරුක් පණුවා

24. තවාන් සාදා පැළ ලබා ගැනෙන බෝග වර්ගයකි.

(1) මිරිස් (2) බතල (3) පතෝල

25. රාත්‍රියට පිපෙන මල් වර්ගයක් නොවන්නේ,

(1) කඩුපුල් (2) හෙන්දිරික්කා (3) ඇට්ටේරියා

26. බීජ හා අතු මඟින් පැළවෙන ශාකයක් වන්නේ,

(1) නිවිති ය. (2) තක්කාලි ය. (3) පතෝල ය.

27. සුළඟ මඟින් පැතිරී බෝවෙන ශාකයක් වන්නේ,

(1) කජු ය. (2) වරා ය. (3) තේක්ක ය.

28. හොඳින් මේරූ බීජයක් හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) ජල භාජනයකට දමන බීජ පතුලට බැසීම.
(2) බීජයේ තැනින් තැන පුල්ලි සහිත වීම.
(3) බීජයේ වර්ණය තද පැහැ නොගැනීම.

29. කෘමි භක්ෂක ශාකයක් නොවන්නේ,

(1) කිඩාරම් (2) පෝෂ්‍ය (3) කඳුලැස්ස

30. මඤ්ඤොක්කා අලවල වඩාත් බහුල ව අඩංගු පෝෂ්‍යක පදාර්ථය වන්නේ,

(1) විටමින් ය. (2) ලවණ ය. (3) කාබෝහයිඩ්‍රේට් ය.

31. පරිසර හිතකාමී කෘමිනාශකයක් සකස් කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය වූ බීජ වර්ගයකි.

(1) කොහොඹ ඇට (2) එඬරු ඇට (3) දඹල ඇට

32. සුළු පිළිස්සීමක දී භාවිතා කරන ඖෂධීය ශාකයකි.

(1) හාතාවාරිය (2) රණවරා (3) කෝමාරිකා

33. රාත්‍රියට පිපෙන මල් වර්ගයකි.

(1) වද මල් (2) සේපාලිකා මල් (3) රෝස මල්

34. පහත සඳහන් කුමන ශාකය ස්වාභාවික ව ම අපට රසවත් පානයක් සකස් කර දෙයි ද?

(1) දොඩම් (2) දෙහි (3) තැඹිලි

35. කරල් හට ගන්නා ගසකි.

(1) මෑ (2) බණ්ඩක්කා (3) දඹල

36. ශරීරය වර්ධනය කරන ආහාරයකි.

(1) කැරට් (2) මුං ඇට (3) අන්නාසි

37. කොම්පෝස්ට් පොහොර නිපදවීමට යොදා ගත හැකි ද්‍රව්‍යයකි.

(1) කොළරොඩු (2)ටින් කැබලි (3) වීදුරු කැබලි

38. බොහෝ සුවඳවත් මලකි.

(1) බෝගන්විලා (2) සේපාලිකා (3) වද

39. වැල්වල සෑදෙන පලතුරු වර්ගයකි.

(1) නෙල්ලි (2) දිවුල් (3) මිදි

40. අතුවල මෙන් ම කඳෙහි ද ගෙඩි හට ගන්නා ශාකයකි.

(1) කොස් (2) වෙරළු (3) මැංගුස්

41. ශක්තිය වඩවන ආහාරයකි.

(1) බණ්ඩක්කා (2) දෙල් (3) බෝංචි

42. රෝස පැහැති දළු හට ගන්නා ශාකයකි.

(1) නා (2) දෙහි (3) කොස්

43. එක් බීජයක් පමණක් තිබෙන පලතුරකි.

(1) දිවුල් (2) මැංගුස් (3) නෙල්ලි

44. කාල නියමයක් නොමැති ව වසර පුරා ම මල් පිපෙන්නේ පහත සඳහන් කුමන ශාකයේ ද?

(1) රබර් (2) පොල් (3) රඹුටන්

45. බොහෝ විට ඇඳුම්වල හෝ සතුන්ගේ ශරීරවල ඇල වී ව්‍යාප්ත වන බීජයකි.

(1) තුත්තිරි (2) හොර (3) වරා

46. පාසල් වත්තේ මිරිස් පාත්තියක් සකස් කිරීමට තෝරා ගත යුත්තේ,

(1) බොරලු සහිත ජලය බැසයන තැනිතලා බිමකි.

(2) හිරුඑළිය අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු සහිත බිමකි.

(3) හිරුඑළිය ඉතා අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරලු රහිත තැනිතලා බිමකි.

47. වියළාගත් මල් තැම්බීමෙන් ඖෂධීය පානයක් පිළියෙළ කිරීමට යොදා ගනු ලබන ශාකයකි.

(1) රණවරා (2) කෝපි (3) තේ

48. තවාන්වලින් පැළ ලබාගෙන පාත්තිවල සිටුවනු ලබන බෝග වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) බෝංචි, බණ්ඩක්කා, නිවිති (2) මාළුමිරිස්, වම්බටු, තක්කාලි

(3) බෝංචි, තක්කාලි, මාළුමිරිස්

49. අමුවෙන් කපා ගත් කැබලි කිහිපයක් දැමීමෙන් භාජනයක ඇති ජලය වර්ණ ගැන්විය හැකි එළවළු වර්ගයකි.

(1) කැරට් (2) බීට්රූට් (3) වට්ටක්කා

50. පිපිරී ඇට වැටීමෙන් ව්‍යාප්ත වන බීජ සහිත ශාකයකි.

(1) හොර (2) පුවක් (3) මදටිය

51. ඒකදේශික ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) දුම්මල, මා වේවැල්, බිං කොහොඹ (2) අඹ, මා වේවැල්, දෙල්

(3) රඹුටන්, දෙල්, දුම්මල

52. ජලයෙන්, සුළඟින් සහ සතුන් මඟින් ව්‍යාප්ත වන බීජ පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) හොර, පොල්, අඹ (2) කඳුරු, අඹ, පොල් (3) කඳුරු, හොර, කජු

53. පැළෑටිවල කොළ ආහාරයට ගන්නා සතෙකි.

(1) සමනලයා (2) දළඹුවා (3) බට්ටිච්චා

54. සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපත් ක්‍රියාවක් වන්නේ,
(1) වවුලන් ශාකවල බීජ තැන තැන දැමීමයි.
(2) දිමියන් ශාක පත්‍ර එකතු කොට දිමිගොටු සෑදීමයි.
(3) ඉත්තෑවන් ශාකවල අල, මුල් ආහාරයට ගැනීමයි.

55. පොළොවෙහි වැඩෙන ශාකයක් ජලය හා පෝෂක උරා ගනු ලබන්නේ,

(1) මුල් මඟිනි. (2) පත්‍ර මඟිනි. (3) මල් මඟිනි.

56. මදුරුවන් මර්ධනය කිරීම සඳහා දුම් ගැසීමට යොදා ගනු ලබන ශාකය වන්නේ,

(1) කොස් (2) මදුරුතලා (3) පොල්පලා

57. දඬු කැබලි සිටුවීමෙන් පැළ ලබා ගත හැකි බෝග වර්ග දෙකකි.

(1) බඩඉරිඟු සහ නිවිති (2) මාළුමිරිස් සහ කංකුං (3) මඤ්ඤොක්කා සහ නිවිති

58. මුහුදු හා කලපු ආශ්‍රිත ව වැඩෙන ශාක වර්ගයකි.

(1) නුග (2) කුඹුක් (3) කඩොලාන

59. තුවාලයක් වූ විගස ම තලා හෝ පොඩිකර තුවාලයට තැබිය හැකි ශාක පත්‍රයකි.

(1) නිදිකුම්බා (2) කරපිංචා (3) දොඩම් කොළ

60. ස්ඵෝටනයෙන් ව්‍යාප්ත වන බීජයකි.

(1) හොර (2) ඔළිඳ (3) කොස්

61. පහත ශාක අතරින් ඒකදේශික ශාකයක් නොවන්නේ,

(1) හීංබෝවිටියා (2) කෙකටිය (3) කොහොඹ

62. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

(1) නිල් මානෙල් මලයි. (2) මානෙල් මලයි. (3) නා මලයි.

63. තාල වර්ගයට අයත් ගසකි.

(1) තේක්ක (2) කිතුල් (3) අඹ

64. අතු නොබෙදෙන ශාකයකි.

(1) පුවක් (2) උණ (3) කෝන්

65. හැඩය අනුව ශාක පත්‍ර වර්ග කළ විට වඩාත් ගැළපෙන කාණ්ඩය තෝරන්න.

(1) උණ - කොස් (2) බණ්ඩක්කා - කොට්ටම්බා

(3) සියඹලා - කතුරුමුරුංගා

66. බීජය පිටතින් පිහිටන ඵලයකි.

(1) අඹ (2) අන්නාසි (3) කජු පුහුලන්

67. මලක කොටසක් නොවේ.

(1) මුල් (2) කීලය (3) කලංකය

68. දිමියන් ගොටු සෑදීමට යොදා ගන්නේ ශාකයේ කුමන කොටස ද?

(1) අතු (2) කඳ (3) පත්‍ර

69. ජලයෙන් යට වී වැඩෙන ශාක වර්ගයකි.

(1) ජපන් ජබර (2) සැල්වීනියා (3) වැලිස්නේරියා

70. එක බීජයක් සහිත ඵලයකි.

(1) මුරුංගා (2) මැංගුස් (3) පුවක්

71. ශාකයක වැඩිපුරම මල් හට ගන්නේ,

(1) සෙවණ සහිත අතුවල (2) අතු මැද

(3) හිරුඑළිය හොඳින් ලැබෙන අතුවල

72. මලක්, ගෙඩියක් හෝ කරලක් බවට පත්වන කොටස පිහිටියේ මල්පෙතිවලට,

(1) ඉහළිනි. (2) මැදිනි. (3) පහළිනි.

73. ජලයේ වැඩෙන ශාක වර්ගයකි.

(1) කෙකටිය (2) ඉරිවේරිය (3) කොහිල

74. කොට්ටම්බා ශාකයේ පත්‍ර ළපටි අවස්ථාවේ වර්ණය වන්නේ,

(1) රතු (2) කොළ (3) ලා කොළ

75. සල් මලක පෙති ගණන වන්නේ,

(1) 4 (2) 6 (3) 5

76. ශාකයකට මුල්වලින් ලැබෙන ප්‍රයෝජනයකි.
(1) පාංශු ඛාදනය වැළැක්වීම
(2) ශාකයට අවශ්‍ය ජලය හා පොහොර උරා ගැනීම
(3) ශාකය අලංකාර කිරීම

77. ආහාරයට ගන්නා මල් වර්ගයකි.

(1) රණවරා මල් (2) බෙලි මල් (3) කතුරුමුරුංගා මල්

78. මෙළෙක් කඳක් සහිත ශාක වර්ගයකි.

(1) කොහොඹ (2) පලු (3) කෙසෙල්

79. කාල නියමයක් සහිතව මල් පිපෙන ශාකයකි.

(1) පොල් (2) රබර් (3) කෙසෙල්

80. සතුන්ගෙන් ශාකවලට සිදුවන අයහපතකි.
(1) මල් පරාගනය (2) බීජ ව්‍යාප්ත කිරීම
(3) ශාකයේ අතු ඉති කඩා දැමීම

81. ගස් වැල්වලින් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) සිසිලස ලබා දීම. (2) දැව ලබා දීම. (3) හිරු රැස් ලබා දීම.

82. පහත ඵල අතරින් කරලක් නොවන්නේ,

(1) රබර් (2) වී (3) මුරුංගා

83. "පිනවන දුටු දන සැම - ගඟ ළඟ පිහිටි කදිම "මෙම ගීතයෙන් කියවෙන ඓතිහාසික ශාකය වන්නේ,
(1) ජය ශ්‍රී, මහා බෝධිය (2) කොළඹ මදාරා ගස (3)දෙනිපිටියේ නුගරුක

84. විදේශ ආක්‍ර මණිකයින් අප රට යටත් කර ගැනීමට යෙදූ උපක්‍රමයක් වන්නේ,
(1) මත් ද්‍රව්‍ය, දුම්වැටි වැනි වැරදි භාවිත වලින් ඉවත් වීම.
(2) මී ගස් පුළුස්සා පස නිසරු කිරීම.
(3) ජනතාව ගොවිතැන් කටයුතු සඳහා උනන්දු කරවීම.

85. රාත්‍රී කාලයට පත්‍ර හැකිළෙන ශාකයක් වන්නේ,
(1) බෙහෙත් නෙල්ලි (2) බිලිං (3) කරපිංචා

86. බැලූනයක් පුම්බා කට ගැට ගසා එය වටා ගම් තවරා බැලූනය නොපෙනෙන සේ මුං ඇට ඇලවීමෙන් ඔබට සාදා ගත හැකි නිර්මාණය වන්නේ,
(1) දෙල් ගෙඩියකි. (2) වම්බටු ගෙඩියකි. (3) මිදි පොකුරකි.

87. සතුන්ගේ ඇගේ දැවටීමෙන් ව්‍යාප්ත වන බීජයක් නොවේ.
(1) කජු (2) නාගදරණ (3) ඇපල

88. කොළකැඳ සෑදීමට නොගන්නා ශාක වර්ගයක් වන්නේ,
(1) දෙහි කොළ (2) යකිනාරං කොළ (3) එළබටු කොළ

89. බීජ අලවා සිදුකරන නිර්මාණ වන්නේ,
(1) අල්පනා මෝස්තර (2) කොලාජ් නිර්මාණ (3) ඔරිගාමී නිර්මාණ

90. යෝධ පුස්වැල පිහිටා තිබෙන්නේ,
(1) මන්නාරම (2) කැබලිත්ත (3) ඕපනායක

91. පැළෑටි වර්ගයක් නොවන්නේ,
(1) පොල්පලා (2) කරපිංචා (3) කුප්පමේනියා

92. රාත්‍රි කාලයට පිපෙන මල් වර්ගයක් වන්නේ,
(1) සේපාලිකා (2) නෙළුම් (3) ඕලු

93. ගස්වැල්වලින් ලැබෙන ප්‍රයෝජනයක් නොවේ
(1) සිසිලස ලැබීම. (2) නියඟය ඇතිවීම. (3) ඖෂධ ලබා දීම.

94. පත්‍ර ඇඟිලිවලට බෙදී ඇති ශාකයක් වන්නේ,
(1) මඤ්ඤොක්කා (2) කොස් (3) පේර

95. සැප්තැම්බර් මාසයේ පිපෙන මලක් වන්නේ,
(1) ඇහැළ (2) බිනර (3) මැයි

96. ශාකවල වර්ධනයට අත්‍යවශ්‍ය සාධකයක් නොවේ.
(1) සෙවණ (2) ජලය (3) වාතය

97. මලක කොටසක් නොවන්නේ,
(1) රේණු (2) මණිපත්‍ර (3) මුල්

98. ඖෂධ ලෙස යොදා ගන්නා ශාක පත්‍රයක් වන්නේ,

(1) රණවරා (2) නියගලා (3) පාවට්ටා

99. මල්වල වර්ණය කෙරෙහි වඩාත් ම බලපාන සාධකයක් වන්නේ,

(1) ජලය (2) වාතය (3) හිරුඑළිය

100. අතීතයේ ජලය පිරිසිදු කරගත් ක්‍රමවේදයකි.

(1) පෙරණභාවිතය (ෆිල්ටර්). (2) ක්ලෝරීන් යෙදීම.

(3) ඉඟිනි ඇට ජලයට දැමීම.

101. කාල නියමයක් සහිතව මල් පිපෙන ශාක අඩංගු පිළිතුර වන්නේ,

(1) එරබඳු, ඇහැළ, ඕලු (2) එරබඳු, නෙලුම්, ඇහැළ

(3) එරබඳු, ඇහැළ, බිනර

102. අහාරයක් ලෙස සකස් කර ගත හැකි මල් විශේෂයකි

(1) කතුරුමුරුංගා මල් (2) වට්ටක්කා මල්

(3) වැටකොළු මල්

103. රත්‍රී කාලයට පමණක් මල් පිපෙන ශාක අඩංගු පිළිතුර වන්නේ,

(1) කඩුපුල්, රෑ මනමාලි, සේපාලිකා

(2) නෙලුම්, කඩුපුල්, සූරියකාන්ත

(3) දාස්පෙතියා, කඩුපුල්, රෑ මනමාලි

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 4. අප අවට සතුන් |
|---|---|---|

සැකසුම :- ශ්‍රියානි ජයලතා
අ/ කිරිගල්වැව විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. දිවා කාලයේ දැකිය හැකි සතෙකි,
   1. වවුලා 2. කපුටා 3. බස්සා
2. පාද ඇත. එහෙත් පියාපත් නැත.
   1. ගිරවා 2. නයා 3. හාවා
3. පාද නැත. එහෙත් වරල් ඇත.
   1. සර්පයා 2. මාළුවා 3. ගිරවා
4. ගෘහ ආශ්‍රිතව ඇති කරන සතෙකි,
   1. එළුවා 2. තලගොයා 3. බල්ලා
5. නිර්මාණශීලි කූඩු සෑදීමේ හැකියාව ඇත.
   1. කොහා 2. වඩු කුරුල්ලා 3. දිමියා
6. කූඩු සෑදීම නිසා ශාක වර්ධනය බාල කරන සතෙකි,
   1. දිමියා 2. වේයා 3. ගිරවා
7. රාත්‍රි කාලයේ හැසිරෙන සතෙක් නොවේ.
   1. බකමූණා 2. දෙමලිච්චා 3. බස්සා
8. සතුන්ගේ යහපැවත්මට හානි කර අවස්ථාවකි,
   1. සතුන් පිරිසිදු කිරීම 2. වාසස්ථාන සකස් කිරීම 3. රසායනික පොහොර යෙදීම
9. සමනලයාගේ ජීවන චක්‍රයේ අවස්ථා ගණන
   1. 2 කි. 2. 3 කි. 3. 4 කි.
10. පක්ෂියෙකුට නොමැති ලක්ෂණයකි,
    1. ඇස් හැරවීමට හැකි වීම 2. පියෑඹීමට හැකි වීම 3. පාද යුගලයක් තිබීම
11. තිරස් හා සිරස් පෘෂ්ඨ දෙකෙහි ම ඇලී සිටිය හැක්කේ,
    1. කටුස්සාට ය. 2. ගෙම්බාට ය. 3. හූනාට ය.
12. බීජ ව්‍යාප්තියට උදව් නොකරයි.
    1. වවුලා 2. ඉබ්බා 3. ගිරවා
13. ගොළුබෙල්ලාට නැත්තේ,
    1. පාද 2. දන්තිකා 3. පා තලය
14. ශාක භක්ෂක සතෙකි,
    1. හාවා 2. නයා 3. කොටියා
15. මාංශ භක්ෂක සතෙකු නොවේ,
    1. සිංහයා 2. බත්කූරා 3. මූවා
16. ජලයේ පමණක් ජීවත්වන සතෙකි,
    1. ඉබ්බා 2. ඉස්සා 3. ගෙම්බා

17. මැටි භාවිත කර වාසස්ථාන හදයි
1. කොට්ටෝරුවා 2. දිමියා 3. වැහිලිහිණියා
18. ක්ෂීරපායි සතෙකු වන්නේ,
1. කටුස්සා 2. කබරගොයා 3. මුගටියා
19. ශ්‍රී ලංකාවේ ඒක දේශීය සත්ත්ව විශේෂයක් වන්නේ,
1. කැහිබෙල්ලා 2. මොනරා 3. ගිරවා
20. වගාවට හානි කරන සත්ත්ව විශේෂයක් නොවන්නේ,
1. කුඩිත්තා 2. පුරුක් පණුවා 3. බත්කූරා
21. රාත්‍රි කාලයේ හැසිරෙන සතෙකු වන්නේ,
1. ගේ කුරුල්ලා 2. ගොළුබෙල්ලා 3. කපුටා
22. ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය සහිතව කිරි නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පිහිටි ප්‍රදේශය වන්නේ,
1. අඹේවෙල 2. වැලිසර 3. හංවැල්ල
23. ශ්‍රී ලංකාවේ ජාතික සත්ත්වයා වන්නේ,
1. කොවුලා 2. ගිරවා 3. දඬුලේනා
24. ශ්‍රී ලංකාවේ ඒක දේශීය ක්ෂීරපායි සතෙකි
1. ගල්පාඬියා 2. කළු වඳුරා 3. පිඹුරා
25. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් වලි කුකුළා තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ,
1. මෙරට බහුල ව සිටීම ය. 2. මෙරටට ආවේණික වීමය
3. සෑම ප්‍රදේශයකම දක්නට ලැබීම
26. රූපයේ දැක්වෙන සත්ත්වයා වන්නේ,



1. කොහා 2. වඩු කුරුල්ලා 3. කෑදැත්තා
27. ගෙමැස්සා මගින් රෝග බීජ ශරීරගත වීමෙන් වැළඳෙන රෝගයකි,
1. පාචනය 2. මහාමාරිය 3. බරවා
28. ක්ෂීරපායි කාණ්ඩයට අයත්වන සතුන් පමණක් ඇතුළත් පිළිතුරු කුමක් ද?
1. කිරලා, මොණරා, ගවයා 2. ගවයා, හිවලා, අලියා
3. ගවයා, හිවලා, දිමියා
29. මල් පරාගනය සඳහා උදවු නොවන සතෙකි,
1. කනෙයියා 2. කපුටා 3. මී මැස්සා
30. කොම්පෝස්ට් පොහොර සාදා ගැනීමට උදව් කරන සතෙකි,
1. ගවයා 2. ඇට් කුකුළා 3. බල්ලා
31. පරිසරයට අලංකාරයක් හා මානසික සුවයක් ලබා දෙන සතුන් වර්ගයකි,
1. බල්ලන් 2. ගවයන් 3. ඇතිකරන මසුන්
32. අල වර්ගවලට හානි කරන නිසාචර සතෙකි,
1. ඉත්තෑවා 2. කලවැද්දා 3. නරියා

33. මැටි යොදාගෙන තම නිවස සාදා ගන්නා කෘමියෙකි,
1. කුඹලා 2. වැහිලිහිණියා 3. නයා

34. පිහාටු නැති නිශාචර සත්ත්වයෙකි,
1. බකමූණා 2. බස්සා 3. වවුලා

35. ජීවන චක්‍රයක් සහිත කෘමියෙකි,
1. ගෙම්බා 2. මදුරුවා 3. මකුළුවා

36. නිතරම තනිව සිටිනවා දැකිය හැකිය,
1. දෙමළිච්චා 2. පිළිහුඩුවා 3. ගිරවා

37. ආර්ථික වාසි ලබා දීමට උදව් නොකරයි
1. නරියා 2. ගවයා 3. එළුවා

38. අඳුරට අකමැති කෘමියෙකි,
1. මදුරුවා 2. කැරපොත්තා 3. ගෙමැස්සා

39. බීජවලට හානිකරන සතෙකි
1. ගුල්ලා 2. මකුණා 3. උකුණා

40. කුඹුරු හා වගුරු බිම ආශ්‍රිතව සැරිසරන පක්ෂයෙකි,
1. කොරවක්කා 2. බට්ටිච්චා 3. දෙමළිච්චා

41. කුඩා පැළැටිවල ළපටි, දලු, පත්‍ර, ආහාරයට ගන්නා නිශාචර සත්ත්වයෙකි,
1. වඳුරා 2. වවුලා 3. ගොළුබෙල්ලා

42. උරගයකු නොවේ,
1. තලගොයා 2. ගෙම්බා 3. හූනා

43. ශාක පත්‍ර උපයෝගී කර ගෙන තම නිවහන සාදා ගන්නේ,
1. දිමියා 2. කපුටා 3. ලේනා

44. බෝග වගාවේ දී ගොවියාට උපකාර වන සතා,
1. ගොයම් මැස්සා 2. මී මැස්සා 3. පලතුරු මැස්සා

45. පරිසරයේ සිටින සත්තු පරිසරයේ සමතුලිතතාව (.............) කිරීමට උදව් කරති.
1. නැති 2. ඇති 3. විනාශ

46. බැරි බර කරේ තියන් ............ ගීතය ගායනා කරන්නේ,
1. එම්. එස්. ප්‍රනාන්දු 2. ෆ්‍රෙඩී සිල්වා 3. මැක්සි ජයවීර

47. කුණු එහා මෙහා පෙරළලා ඒවා පොහොර කර දෙන සතා වන්නේ,
1. කපුටා 2. ගැඩවිලා 3. පණුවා

48. සමනලයා බිත්තර දමන්නේ ශාක පත්‍රවල
1. යටිපැත්තේ 2. උඩ පැත්තේ 3. තටුවේ

49. කෘමියෙකුගේ පාද ගණන වන්නේ,
1. 6 කි. 2. 3 කි. 3. 4 කි.

50. ගමන බිමන හරි කඩිසර ...... ගීතය ගයන්නේ,
1. ලතා වල්පොල 2. මැක්සි ජයවීර 3. ෆ්‍රෙඩී සිල්වා

51. සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපතක් නොවන්නේ,
1. මල්වල පරාගනය 2. බීජ පිපිර යාම
3. සත්ත්ව මල මුත්‍රා පොහොර ලෙස ලැබීම 4. ශාක පත්‍ර වලට හානි සිදු කිරීම

52. වායව පරිසරයේ ජීවත්වන සතෙකුගේ ලක්ෂණ වන්නේ,
   1. පිහිනීමට වරල් තිබීම   2. පියෑඹීමට පිහාටු, පියාපත් තිබීම
   3. සමේ වර්ණය වෙනස්කර ගත හැකි වීම

53. අශ්වයෙකුගේ ගමන් විලාසය දැක්වෙන වන්නම වන්නේ,
   1. මුසලඬි වන්නම   2. හනුමා වන්නම   3. තුරඟා වන්නම

54. දිගු දිවයොදා ගනිමින් ගොදුරු අල්ලා ගන්නේ,
   1. හූනා   2. කිඹුලා   3. ගොලුබෙල්ලා

**55. නිවසේ සහ ගෙවත්තේ සැරිසරන සතුන්ගේ රූප සටහන් පහත දැක්වේ. කොටුවේ ඇති නම් අතරින් එම සතුන් තෝරා තිත් ඉරිමත ලියන්න.**

1.  ..........................

2.  ..........................

3.  ..........................

4  ..........................

(ගෙමැස්සා, මී මැස්සා, බත්කූරා, කැරපොත්තා, සමනලයා, මකුළුවා, වේයා)

**56. පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗)ලකුණ ද වරහන් තුළ යොදන්න.**

1. වවුලා පියෑඹිය හැකි ක්ෂීරපායි සතෙකි. ( )
2. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වලිකුකුළා ය. ( )
3. ගිරවා ගස්වල බෙන සාදයි ( )
4. සෑම කෘමි සතෙකුට ම පියඹා යා හැකිය ( )
5. මී මැස්සා, මදුරුවා, කුරුමිණියා වායව පරිසරයේ වෙසෙන සතුන් වේ. ( )
6. තුරඟා වන්නමෙන් වඳුරාගේ ගමන් විලාසය ගැන කියවේ. ( )
7. වනාන්තර ගිනි තැබීම නිසා සතුන්ට හානි සිදු නොවේ. ( )
8. හැකරැල්ලා බහුපාද සහිත සතෙකි. ( )
9. පරිසරයේ ඇති සතුන් ආරක්ෂා කරමින් රැක බලා ගැනීම අප කාගෙත් යුතුකමක් වේ. ( )
10. ඉවත දමන කඩදාසි, ගොක්කොළ, විවිධ ශාක කොටස් මගින් සත්ත්ව රූප නිර්මාණය කළ හැකි ය. ( )

**57. පහත දැක්වෙන සත්ත්ව අනුකරණ චලන හඳුනාගෙන එයට අදාළ අංකය තිත් ඉරිමත ලියන්න.**

1.  ..........................

2.  ..........................

3.  ..........................

4  ..........................

1. අලියාගේ ගමන් කිරීම   2. වඳුරෙකු සේ පැන පැන යාම
3. කකුළුවෙකුසේ ගමන් කිරීම   3. දළඹුවෙකුසේ ගමන් කිරීම

**58. සතුන්ගේ පැවත්ම සඳහා ඉවහල්වන ශරීර ලක්ෂණ අනුව, සතුන් හඳුනාගෙන සුදුසු පරිදි යා කරන්න.**

| | | |
|---|---|---|
| 1. | මත්ස්‍යයෝ | ආරක්ෂාව සඳහා කටුව තුළ සැඟවීම. |
| 2. | පක්ෂීහු | ගොදුර සොයා ගැනීමට රැවුල් කෙඳි තිබීම. |
| 3. | කටුස්සා | පිහිනීම සඳහා වරල් තිබීම. |
| 4. | ඉබ්බා | පියෑඹීම සඳහා පිහාටු පියාපත් තිබීම. |
| 5. | පූසා | ආරක්ෂාව සඳහා සමේ වර්ණය වෙනස් කිරීම. |

**59. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

1. පියාපත් විනිවිද පෙනෙන කෘමි සතෙකි. (ගෙමැස්සා, බත්කූරා)
2. බිත්තර මගින් බිහිවන සතෙකි. (හූනා, වවුලා)
3. කෘමි සතෙකුට පාද යුගල ( 6 කි, 3 කි)
4. වගාවට හානිකරන ගොලුබෙල්ලන් ආහාරයට ගනියි (ඇටිකුකුළා, ඉත්තෑවා)
5. පස සාරවත් කිරීමට උදවු කරන සතෙකි. (පත්තෑයා, ගැඩවිලා)
6. වේගයෙන් දිවීමට හැකි පක්ෂියෙකි. (පැස්බරා, මොනරා)
7. මිනිසුන්ට හිතවත්ය. පුරු පුරු ගායි. නිවසෙහි වෙසෙයි. (බල්ලා, පූසා)
8. සත්ත්ව අනුකරණ චලන සිදුකිරීමේ වාසියකි (පේෂි ශක්තිය සංවර්ධනය වීම, අත් පා සන්ධි ආබාධ ඇති වීම)

❖ **පහත කොටුවේ දැක්වෙන අපේ රටට ආවේණික සතුන් වර්ග කර , වගුවේ අදාළ තැන්හි ලියා දක්වන්න.**

| |
|---|
| යක් කටුස්සා, කලවැද්දා, හික්මීයා, මල්පුලුට්ටා, ගල්පාඬියා, දිය නයා, බුලත්හපයා, වලි කුකුළා, කළු වඳුරා, හබන් කුකුළා) |

| **පක්ෂීන්** | **ක්ෂීරපායින්** | **උරගයෝ** | **මත්ස්‍යයෝ** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 5. අප පරිහරණය කරන දේ

සැකසුම :- අයි.ජී. හංසවති ප්‍රේමරත්න
අ/ ඇටවීරගොල්ලෑව විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ධීවර කර්මාන්තයේ දී භාවිතා වන වචනයක් නොවන්නේ,
   1. මණ්ණඩිරාල 2. අවගාරය 3. අතංගුව 4. මඩිය

2. බිත්තියේ ගසා ඇති ස්කුරුප්පු ඇණයක් ගැලවීමට සුදුසු උපකරණය වන්නේ,
   1. අඬු මිටිය 2. ඩැහි අඬුව 3. නියන 4. අලංවගුවයි

3. බිත්තියක් බැඳීමේ දී සිරස් බව මැනීමට යොදා ගනු ලබන උපකරණයකි.
   1. ලඹ කැටය 2. මුලු මට්ටම 3. මනිස් ලෑල්ල 4. මට්ටම් ලීය

4. නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් අපට ඇතිවන වාසියක් නොවන්නේ,
   1. ඉක්මනින් කාර්යය කරගත හැකිවීම. 2. වැඩ පහසු වීම.
   3. නිවැරදිව කරගත හැකි වීම. 4. විදුලි බලය වැයවීම.

5. මැහුම් අලංකාර කරගැනීමට සඳහා යොදාගනු ලබන එක් මැහුම් ක්‍රමයක් පහත දැක්වේ. මෙම මැහුම හඳුන්වනු ලබන නම කුමක් ද?



   1. දම්වැල් මැස්ම
   2. බ්ලැන්කට් මැස්ම
   3. හුරුළු කටු මැස්ම
   4. කතිර මැස්ම

6. පාරිභෝගික වෙළඳ භාණ්ඩයක ප්‍රමිතිය සහතික කරන ශ්‍රී ලාංකික ලාංඡනය කුමක් ද?
   1. SLS 2. SOS 3. ISO 4. ISBN

7. පහත සඳහන් උපකරණ භාවිතයට ගනු ලබන්නේ කවර කර්මාන්ත වල දී ද?
   1. සකපෝරුව - .................................................................................
   2. පෝරු ලෑල්ල - .................................................................................
   3. කිණිහිර - .................................................................................
   4. මනිස් ලෑල්ල - .................................................................................

8. ධීවරයින් කුඩා මසුන් ඇල්ලීමට යොදා ගන්නා ගොටුවක් වැනි උපකරණය හඳුන්වන නම කුමක් ද?
   1. නාම්බුව 2. මා දැල 3. අතංගුව 4. මඩිය

9. ප්ලාස්ටික් කෝප්පයක අසුරන ලද යෝගට් කෑමට ප්‍රථම විශේෂයෙන් සැලකිලිමත් විය යුත්තේ,
   1. අසුරන ලද දිනය ගැනයි. 2. කල් ඉකුත් වන දිනය ගැනයි
   3. අඩංගු දේ ගැනයි. 4. ප්‍රමිති ලාංඡනය ගැනයි.

10. දී ඇති උපකරණ අතරින් කම්බි ඇණයක් සවිකිරීමට සහ ගැලවීම සඳහා යොදා ගතහැකි වඩාත් ම සුදුසු උපකරණය වන්නේ,

1. 

2. 

3. 

4. 

11. පහත රූප නම් කරන්න.

1. 

2. 

3. 

............................ ............................. ..........................

12. බත් පිසීම සඳහා සහල් ගැරීමට වඩාත් උචිත භාජනය වන්නේ,
1. මැටි කෝප්පය 2. වළඳ ය 3. නැඹිලිය යි 4. කොරහයි

13. ගෙවතු වගාවේ දී භාවිතා කරන උපකරණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
1. උදැල්ල, මුල්ලුව හා ලඹය 2. මයිනහම, නගුල හා රේක්කය
3. යතුකැටය, උදැල්ල හා මිටිය 4. උදැල්ල, මුල්ලුව හා රේක්කය

14. කිණිහිර භාවිත කරනු ලබන්නේ,
වඩු මඩුවේ ය. 2. කම්මලේ ය. 3. කුඹුරේ ය. 4. පතලේ ය.

15. සකපෝරුව යොදාගනු ලබන්නේ,
1. වළං කර්මාන්තය සඳහා ය. 2. කුඹුරු වැඩ සඳහා ය.
3. පතල් කර්මාන්තය සඳහා ය. 4. මැණික් ඔපමට්ටම් කිරීම සඳහා ය.

16. පහත දැක්වෙන උපකරණ අතුරෙන් බීම බෝතලයක් විවෘත කිරීමට යොදා ගැනෙන්නේ,

1. 

2. 

3. 

4. 

............................ ............................. .......................... ..........................

17. ලීයක කැටයමක් කපා ගැනීමට භාවිතා කළ හැකි සුදුසු ම උපකරණය වන්නේ,
1. බුරුමය 2. කතුර 3. නියන 4. යතු කැටය

18. ඇඳුමක තැවරුණු තාර පැල්ලමක් ඉවත් කිරීමට සුදුසු ම ද්‍රව්‍ය වන්නේ,
1. පොල්තෙල් 2. භූමිතෙල් 3. දෙහි යුෂ 4. සබන්

19. හිරමනය මුවහත් කිරීම සඳහා භාවිත කරන උපකරණය වන්නේ,
1. කියත ය. 2. පීර ය. 3. මිටිය ය. 4. නියන ය.

20. ටින්මාළු මිලදී ගැනීමේ දී අඩුම අවධානයක් යොමු විය යුතු කරුණ වන්නේ,
1. කල් ඉකුත්වීමේ දිනයයි. 2. භාණ්ඩ මිලදී ගන්නා වෙළඳසැලයි
3. භාණ්ඩයේ ගුණාත්මක බවයි. 4. භාණ්ඩයේ වෙළඳ නාමයයි.

21. රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය වඩාත් සුදුසු වන්නේ,



1. ඉරුණු ඇඳුමක් මැසීමට ය.
2. බොත්තම් කාසයක් මැසීමට ය
3. ඇඳුමක වාටියක් මැසීමට ය
4. කමිසයක කොළරය මැසීමට ය

22. වියගහ භාවිත කරන්නේ,

1. මැටි කර්මාන්තයේ දී ය.  2. කෘෂි කාර්මාන්තයේ දී ය.
3. රෙදිපිලි කර්මාන්තයේ දී ය.  4. ලෝහ කර්මාන්තයේ දී ය.

23. සෙක්කුව භාවිතා කරනු ලබන්නේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?

1. සී සෑම  2. වී (බැත) හුළං කිරීම.
3. තෙල් සිඳීම  4. පිටිකෙටීම

24. රූපයේ දැක්වෙන උපකරණය කුමක් ද?



1. ඩැහි අඬුව
2. දඬු අඬුව
3. බුරුමය
4. යතු කැටය

25. ලේන්සුවක මලක් මැසීමේ දී මලෙහි නටුව මසා ගැනීමට වඩාත් ම සුදුසු මැහුම් ක්‍රමය කුමක් ද?

1. නැටි මැස්ම  2. කතිර මැස්ම.  3. පිස්මේන්තු මැස්ම  4. බ්ලැන්කට් මැස්ම

26. වඩු කර්මාන්තයේ දී යොදා ගනු ලබන උපකරණයකි.

1. 
2. 
3. 
4. 

.............................. .............................. ........................... ...........................

27. මෙම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,



1. දම්වැල් මැස්ම නමිනි.
2. කතිර මැස්ම නමිනි.
3. බ්ලැන්කට් මැස්ම නමිනි.
4. නැටි මැස්ම නමිනි.

28. ගෙවතු වගාවේ දී භාවිත කරනු ලබන උපකරණය දැක්වෙන රූපය කුමක් ද?

1. 
2. 
3. 
4. 

............................ ............................. ........................... ...........................

29. ''මයිනහම'' භාවිතා කරන්නේ,

1. වඩුවා  2. ධීවරයා  3. පෙදරේරුවා  4. කම්මල් කරුවා

30. කොට්ට උරයකට රූපයේ දැක්වෙන පරිදි මලක් මැසීමේ දී මල්පෙති වටේ යෙදිය යුතු මැස්ම කුමක් ද?



1. දම්වැල් මැස්ම
2. නැටි මැස්ම
3. බ්ලැන්කට් මැස්ම
4. කතිර මැස්ම

31. පෞද්ගලික ව පරිහරණය කළයුතු භාණ්ඩ වර්ග දෙකකි.
1. දුරකථනය - පෑන
2. පනාව - දත්බුරුසුව
3. පනාව - කුඩය
4. කුඩය - දත්බුරුසුව

32. කුඹුරු ගොවිතැනේ දී භාවිතා කරනු ලබන උපකරණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. උදැල්ල, සකපෝරුව, වියගහ
2. වියගම, දෑකැත්ත, නගුල
3. නගුල, සෙක්කුව, දැති පෝරුව
4. අතංගුව, උදැල්ල, දෑකැත්ත

33. පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අතුරින් නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩුම කාලයක් ඇත්තේ කුමකට ද?
1. ටින්මාළු
2. යෝගට්
3. ජෑම්
4. චීස්

34. සෙක්කුව යොදාගනු ලබන්නේ,
1. ඇණ ගැසීමට ය.
2. කළුගල් කැඩීමට ය.
3. තෙල් සිඳීමට ය.
4. බර ඇදීමට ය.

35. කුස්සියේ භාවිතා නොකරන උපකරණයකි.
1. පිහිය
2. හිරමනය
3. දෑකැත්ත
4. වංගෙඩිය

36. රූපයේ දැක්වෙන මැස්ම කුමක් ද?



1. නැටි මැස්ම
2. දම්වැල් මැස්ම
3. බ්ලැන්කට් මැස්ම
4. පිස්මේන්තතු මැස්ම

37. හිරමනය සහ කියත මුවහත් කිරීම සඳහා භාවිතා කරන උපකරණය කුමක් ද?
1. පීර
2. නියන
3. තෙල්ගල
4. කිණිහිර

38. කිණිහිර භාවිතා කරනු ලබන්නේ,
1. පෙදරේරුවා
2. විදුලි කාර්මිකයා
3. කම්මල්කරුවා
4. වඩුවා

39. භාණ්ඩ සඳහා ලබාදෙන ජාත්‍යන්තර තත්ත්ව සහතිකය වන්නේ,
1. ISO සහතිකය
2. ISBN සහතිකය
3. SLS සහතිකය
4. සූර්ය නමස්කාරය

40. පුස්තකාලයක පොත් තබා ඇති ආකාරය පිළිබඳව වැරදි ප්‍රකාශය වන්නේ,
1. විෂයන් අනුව පොත් වර්ග කර තැබීම.
2. පොත් තිරස් අතට තබා තිබීම.
3. අංක අනුව වර්ග කර තැබීම
4. භාෂාවන් අනුව පොත් වෙන් කර තැබීම.

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 6. අපේ ආහාර |
|---|---|---|

සැකසුම :- දීපිකා රාජගුරු
අ/ මෛත්‍රීපාල සේනානායක ප්‍රා.වි

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කාර්යාලය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. "අයඩින්කරණය කරන ලද ලුණු පැකට්ටුවක පහත සඳහන් සංකේතය දක්වා ඇත.මෙයින් අදහස් කෙරෙන්නේ කුමක් ද?



   1. තෙතමනය ඇති තැනක නොතබන්න.
   2. නළ ජලය යොදා ගැනීමෙන් වළකින්න.
   3. නොසෝදා පාවිච්චි කරන්න.
   4. උණු වතුරෙන් පමණක් සෝදන්න.

2. ගලගණ්ඩය රෝගයට ප්‍රධාන හේතුවක් වන්නේ,
   1. අයඩීන් ඌනතාව 2. යකඩ ඌනතාව 3. විටමින් ඌනතාව
   4. කැල්සියම් ඌනතාව
3. ලුණු කුඩු ඉක්මනින් ම දිය වන්නේ,
   1. උණු ජලයේ 2. ඇල් ජලයේ
   3. ශීත කළ ජලයේ 4. උණුකර නිවාගත් ජලයේ
4. බතල වල ඇති බහුලම පෝෂකය වන්නේ,
   1. ප්‍රෝටීන් 2. පිෂ්ටය 3. විටමින් 4. ලිපිඩ
5. වැලි යට තැබීමෙන් කල් තබා ගත හැකි ආහාර වර්ග සඳහා නිදසුනකි,
   1. දෙහි,මාළු 2. අඹ,අල 3. ළූණු,දෙල් 4. දෙහි,කොස් ඇට
6. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝගයක් වන්නේ,
   1. මැලේරියාව 2. ක්ෂය රෝගය 3. මී උණ 4. සෙංගමාලය
7. විටමින් බහුල ආහාරයක් වන්නේ,
   1. කඩල ය 2. බතල ය 3. සෝයා ය 4. තක්කාලි ය
8. දියවැඩියා රෝගය පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු ආහාරය වන්නේ,
   1. පාන් 2. නූඩ්ල්ස් 3. කව්පි 4. මඤ්ඤොක්කා
9. "කළු පොල් මාලුව"පිළියෙල කර ගැනීමේ දී යොදා ගනු ලබන බීජ වර්ගයක් වන්නේ,
   1. කළු කව්පි ය 2. කොස් ඇටය 3. රට දෙල් ය 4. බිං පොල් ය
10. පියනකින් නො වසා පිසිය යුතු ආහාර වර්ගයක් වන්නේ,
   1. බතල ය 2. දෙල් ය 3. මඤ්ඤොක්කා 4. කොස් ය
11. ඇලුමිනියම් භාජනයක පිසිනු ලබන ආහාරයට මිශ්‍ර කිරීමට සුදුසු ද්‍රව්‍යක් නොවන්නේ,
   1. කුරුඳු 2. සුදු ළූණු ය 3. ගොරක ය 4. ඉඟුරු ය

12. අත්වල කොහොල්ලෑ ගැවුනු විට ඒවා පහසුවෙන් ඉවත් කර ගැනීමට යොදා ගත හැකි සුදුසු දේ වන්නේ,
1. සබන් 2. ඇල් ජලය 3. උණු ජලය 4. භූමිතෙල්

13. ශරීර වර්ධනය සඳහා වැඩි බලපෑමක් ඇති කරනු ලබන ආහාර යුගලය වන්නේ,
1. එළකිරි සහ දොඩම් ය 2. බිත්තර සහ කුරක්කන් රොටිය
3. මුං ඇට සහ සෝයා බෝංචි ය 4. සෝයා බෝංචි සහ නිවිතිය

14. කැඳ සෑදීම සඳහා ගන්නා කොළ වර්ගයක් නොවන්නේ,
1. ගොටු කොළ ය 2. යකි නාරං කොළ ය
3. කෝප්ප කොළ ය 4. එළබටු කොළ ය

15. ප්ලාස්ටික් කෝප්පයක අසුරන ලද යෝගට් කෑමට ප්‍රථම විශේෂයෙන් සැලකිලිමත් විය යුත්තේ,
1. අසුරන ලද දිනය බැලීම 2. කල් ඉකුත් වන දිනය බැලීම
3. අඩංගු දේ බැලීම 4. ප්‍රමිති ලාංඡනය බැලීම

16. බත් පිසීම සඳහා සහල් ගැරීමට වඩාත් ම උචිත භාජනය වන්නේ,
1. මැටි කෝප්පයකි 2. වළඳයි 3. නැඹිලියයි 4. කොරහයි

17. ලේන්සුවක මලක් මැසීමේ දී මලෙහි නටුව මසා ගැනීමට නම් වඩාත් ම සුදුසු මැහුම් ක්‍රමය කුමක් ද?
1. නැටි මැස්ම 2. කතිර මැස්ම 3. පිස්මේන්තු මැස්ම 4. බ්ලැන්කට් මැස්ම

18. සිරුරට අවශ්‍ය ප්‍රෝටීන් ලබා ගැනීම සඳහා සුදුසු ආහාරයක් වන්නේ,
1. අර්තාපල් ය. 2. පරිප්පු 3. කැරට් 4. ගොටු කොළ

19. මෙම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,



1. දම්වැල් මැස්ම නමිනි
2. කතිර මැස්ම නමිනි
3. බ්ලැන්කට් මැස්ම නමිනි
4. නැටිමැස්ම නමිනි

20. මඤ්ඤොක්කා අලවල වඩාත් බහුලව අඩංගු පෝෂ්‍ය පදාර්ථය වන්නේ,
1. විටමින් 2. කාබෝහයිඩ්‍රේට 3. ලවණ 4. ප්‍රෝටීන

21. ශරීර වර්ධනය කිරීම සඳහා වැඩිම දායකත්වයක් සැපයෙන ආහාර ද්‍රව්‍ය කාණ්ඩයකි,
1. බත්,සීනී,මුං ඇට 2. පරිප්පු,නිවිති,ගොටු කොළ
3. පරිප්පු,මුං ඇට,සෝයා බෝංචි 4. අඹ,අන්නාසි,දොඩම්

22. වෙළඳපොළලේ ඇති බීම බෝතලයක අධික සීනි සහිත බව දැක්වෙන වර්ණය,
1. රතු වර්ණය 2. කහ වර්ණය 3. කොළ වර්ණය

23. පාන් කැබැල්ලක් කල් ඉකුත්වීමේදී දැකිය හැකි ලක්ෂණයකි,
1. හොඳ සුවඳකින් යුක්ත වීම 2. ප්‍රනීත සුවඳකින් යුක්ත විම
3. ඇලෙන සුළු ස්වභාවයකින් යුක්ත විම

24. අඹ මාළුවක් පිසීමට භාවිතා නොකල යුතු භාජනයයි,
1. පිත්තල 2. ඇළුමිනියම් 3. මැටි

25. වියලීමෙන් කල් තබා ගත හැකි ආහාරයක් නොවන්නේ
1. දෙල් 2. කොස් 3. කෙසෙල්

26. ආහාර ගැනීමේ දී පිළිපැදිය යුතු පුරුද්දක් නොවේ,
   1. තමන්ට අවශ්‍ය පරිදි කෑම බෙදා ගැනීම
   2. ඉවතලන දෑ පිඟානේ පසෙකින් තබා ගැනීම
   3. යහළුවන්ගේ පිඟන් මත තිබෙන ආහාර දෙස බැලීම

27. මේදය බහුල ආහාරයක් වන්නේ,
   1. රටකජු 2. දඹල 3. නිවිති

28. අච්චාරු බෙදා ගැනීම සඳහා වඩාත් සුදුසු හැඳි වර්ගය වන්නේ,
   1. පිත්තල 2. ඇළුමිනියම් 3. පොල් කටු

29. මඤ්ඤොක්කා සමග එකතු කළ විට විෂ වන දෙයක් වන්නේ,
   1. දෙල් 2. ඉරිඟු 3. ඉඟුරු

30. හබල පෙති සෑදීමට ගන්නා ධාන්‍ය වර්ගයක් වන්නේ,
   1. තල 2. වී 3. කුරක්කන්

31. විටමින් C බහුල ආහාරයක් වන්නේ,
   1. දොඩම් 2. කඩල 3. මුං

32. දියවැඩියා රෝගීන් සඳහා සුදුසු ආහාරයක් වන්නේ,
   1. කුරක්කන් රොටී 2. හකුරු 3. පාන්

33. ඉස්සෝ ව්‍යංජන සෑදීමේ දී එහි උෂ්ණාධික බව අවම කිරීමට යොදන ශාක පත්‍ර විශේෂය වන්නේ,
   1. කතුරුමුරුංගා 2. මුරුංගා 3. සේර

34. ප්‍රෝටීන් බහුල ආහාරයක් නොවන්නේ,
   1. මාළු 2. දඹල 3. ගොටු කොළ

35. යකඩ බහුලවම ඇත්තේ,
   1. කැරට් 2. නිවිති 3. දොඩම්

36. අපිරිසිදු ආහාර ගැනීමෙන් ඇතිවන රෝග තත්ත්වයකි,
   1. සෙංගමාලය 2. පාචනය 3. උණසන්නිපාතය

37. ශරීරය වර්ධනය කරන ආහාර කාණ්ඩයක් වන්නේ,
   1. බත්, කොස් 2. අර්තාපල්, සීනි 3. දඹල, මුං ඇට

38. පියනකින් නොවසා පිසිය යුතු ආහාරයක් වන්නේ,
   1. කොස් 2. දෙල් 3. මඤ්ඤොක්කා

39. අර්ධ ලෙස සකස් කළ ආහාර වර්ගයක් නොවන්නේ,
   1. පපඩම් 2. සොසේජස් 3. සහල්

40. මෙම අල වර්ගය තම්බා ගැනීමේදී විෂ සහිතය,
   1. නියගලා 2. හුළං කීරිය 3. අර්තාපල්

41. මී පැණි වල දමා කල් තබා ගන්නා ආහාරයකි,
   1. මස් 2. කරවල 3. මාළු

42. ශාක හෝ සත්ත්ව නොවන ආහාරයක් වන්නේ,
   1. බිම්මල් 2. සීනි 3. මාළු

43. ඒප්‍රනය නිතර භාවිතා කරනු ලබන්නේ,
   1. කෝකියා 2. හෙදිය 3. ගුරුවරයා

44. ආහාර රසවත් කිරීමට යොදා ගන්නා පොතු වර්ගයකි,

1. සේර 2. රම්පේ 3. කුරුඳු

45. පූර්ණ ලෙස සකස් කර ඇති ආහාරයක් වන්නේ

1. පරිප්පු 2. නූඩ්ලස් 3. චීස්

46. ආහාර රසවත් කිරීමට යොදා ගන්නා ස්වභාවික රසකාරයක් නොවන්නේ,

1. කරපිංචා 2. සූදුරු 3. අජිනමොටෝ

47. දවසේ ආහාර වේල් අතරින් වැදගත්ම ආහාර වේල වන්නේ,

1. උදේ 2. දවල් 3. රාත්‍රී

48. ආහාරපාන වැඩි වීම නිසා ඇතිවන රෝගී තත්ත්වයකි,

1. අධිරුධිර පීඩනය 2. දියවැඩියාව 3. තරබාරු බව

49. හුමාලයෙන් තම්බා සකස් කර නොගන්නා ආහාරයකි,

1. ඉඳි ආප්ප 2. ආප්ප 3. පිට්ටු

50. කැල්සියම් ඌනතාවය නිසා ඇති වන රෝගයක් වන්නේ,

1. ගලගණ්ඩය 2. අස්ථි දිරායාම 3. සෙංගමාලය

51. අප විසින් පාලනයකින් යුතුව ශරීරයට ලබාගත යුතු පෝෂ්‍ය පදාර්ථ තුන වන්නේ,

1. සීනි, ලුණු, මේදය හෙවත් තෙල් 2. විටමින්, ලුණු, සීනි

3. මේදය හෙවත් තෙල්, ලුණු, ජලය

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 7. ආරක්ෂාව හා පරිස්සම |
|---|---|---|

සැකසුම :- අමිල මදුසංඛ
අ/ මෛත්‍රීපාල සේනානායක ප්‍රා.වි

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ගෙමැස්සා මගින් රෝග බීජ ශරීරගත වීමෙන් වැළඳෙන රෝගයකි

   1.පාචනය  2. මහාමාරිය  3. බරවා  4. චිකුන්ගුන්‍යා

2. "දිය නෑමට අනාරක්ෂිතයි" ලෙස වැවක් අසල දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට අදාළ**නොවන** කරුණක් වන්නේ කුමක් ද?

   1. ජලය බීමට ගැනීම  2. ගැඹුරු ස්ථානයක් වීම
   3. කිඹුලන් සිටීම  4. මඩ සහිත වීම

3. මැස්සන් නිසා පැතිරීමට ඉඩ ඇති රෝගයකි

   1. මැලේරියාව  2. මහාමාරිය  3. ජලභීතිකාව  4. පාචනය

4. අපිරිසිදු ජලය පානය කිරීම නිසා ඇති විය හැකි රෝගයකි.

   1. බරවා  2. ඩෙංගු  3. කොළරාව  4. චිකුන්ගුන්‍යා

5. මදුරුවන් මර්දනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් **නොවන්නේ**
   1. වටපිටාව පිරිසිදු ව තබා ගැනීමයි.
   2. මදුරුතලා කොළ පුළුස්සා දුම් ගැසීමයි.
   3. ජලය රැස් වන ස්ථාන නැති කර දැමීමයි.
   4. ජලය දැමූ භාජන මත මල් දැමීමයි.

6. කෘත්‍රිම වර්ණක හා රසකාරක යොදන ලද ආහාර භාවිතයෙන් ඇති විය හැකි රෝගයකි

   1. ජලභීතිකාව  2. පිළිකා  3. උණසන්නිපාතය 4. දියවැඩියාව

7. ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයකි
   1. උණු කර නිවාගත් ජලය පානය කිරීම.
   2. පිසූ ආහාර හොඳින් වසා තැබීම.
   3. අවට පරිසරය පිරිසිදු කිරීම.
   4. එළවළු වැඩිපුර ආහාරයට ගැනීම.

8. ජලභීතිකාව රෝගය වැළඳීමට හේතු වන රෝග බීජ මිනිස් සිරුරට ඇතුළු විය හැක්කේ පහත සඳහන් කුමන සත්වයාගෙන් ද?

   1. මදුරුවා  2. කැරපොත්තා  3. බළලා  4. ගෙමැස්සා

9. ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන වසංගත රෝග වැඩි සංඛ්‍යාවක් සඳහා හේතු වන සත්ව වර්ගය

   1. මීයන් ය  2. බල්ලන් ය  3. මදුරුවන් ය  4. මැස්සන් ය

10. සමාජ විරෝධී ක්‍රියාවක් **නොවන්නේ** පහත සඳහන් කවරක් ද?
   1. මත්ද්‍රව්‍ය වෙළඳාම
   2. ළමයින් සේවයට යොදවා ගැනීම
   3. දුම්රිය පොළෙහි දී දුම් පානය කිරීම
   4. බස් රථ තුළ ආහාර ද්‍රව්‍ය විකිණීම

11. ගිනි ගැනීමකින් ශරීරයේ යම් ස්ථානයක් පිළිස්සුණු පුද්ගලයෙකුට ප්‍රථමාධාර ලබා දීමේ දී අප විසින් පළමුවෙන් ම කළ යුතු දෙය කුමක් ද?
   1. පිළිස්සුණු ස්ථානයට ඇලී ඇති ඇඳුම් ඉවත් කිරීම.
   2. පිළිස්සුණු ස්ථානය මත තෙල් වර්ගයක් ආලේප කිරීම.
   3. දිය බිබිලි මත ආලේපන වර්ගයක් ගැල්වීම.
   4. පිරිසිදු ඇල් දියෙන් පිළිස්සුණු ස්ථානය සිසිල් කිරීම.

12. මීයාගේ ඇඟේ වසන මැක්කකු මඟින් බෝ වන රෝගය කුමක් ද?
   1. පාචනය
   2. බරවා
   3. ජලභීතිකාව
   4. මහාමාරිය

13. මදුරුවන් අප වෙත ළං වීම වැළැක්වීම සඳහා ශරීරයේ තැවරීමට සුදුසු තෙල් වර්ගයකි.
   1. එළවළු තෙල්
   2. තල තෙල්
   3. පැඟිරි තෙල්
   4. පොල් තෙල්

14. අනතුරක් සිදු වීමට වඩාත් ම ඉඩ ඇති අවස්ථාවකි.
   1. සංඥා එපි පුවරුවක රතු පාට මිනිසා දිස්වෙමින් තිබිය දී කහ ඉර මතින් වාහනය ගමන් කිරීම
   2. අකුණු අවස්ථාවක නිවසක ලී ඇඳක් මත නිදාගෙන සිටීම.
   3. ක්‍රීඩා උත්සවයක් අවසන් වූ විට රතිඤ්ඤා පත්තු කිරීම.
   4. වියළි රබර් පා පිස්සක් මත සිටගෙන විදුලි ඉස්තිරික්කයෙන් ඇඳුම් මැදීම.

15. පුද්ගලයෙකුගේ පාදයකට සර්පයෙකු දෂ්ට කර ඇති අවස්ථාවක ,එම පුද්ගලයාට ප්‍රථමාධාර ලබා දීමේ දී මුලින් ම කළ යුතු වන්නේ
   1. සර්පයා සොයා හඳුනා ගැනීම.
   2. දෂ්ට කළස්ථානය පිරිසිදු ඇල් ජලයෙන් සේදීම ය.
   3. වෙළුම් පටි මගින් පාද ගැට ගසා නොසොල්වා තැබීම ය.
   4. උණු පානයක් ලබා දීම ය.

16. මදුරුවන් නිසා පැතිරෙන රෝග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
   1. මැලේරියාව, ඩෙංගු, බරවා
   2. මැලේරියාව, පාචනය, මහමාරියා
   3. පාචනය, මහමාරියා, ඩෙංගු
   4. ඩෙංගු, මැලේරියාව, පාචනය

17. අනාරක්ෂිත අවස්ථාවක් වන්නේ පහත සඳහන් කවරක් ද?
   1. පදික වේදිකාවක ගමන් කිරීම.
   2. මාර්ග සංඥා එළි පුවරුවක 'කොළ පාට මිනිසා' දර්ශනය වන විට පාර හරහා මාරු වීම.
   3. පයින් ගමන් කරන විට තමන්ගේ දකුණු පැත්තෙන් ගමන් කිරීම.
   4. දුම්රිය මාර්ගයේ ගමන් කිරීම.

18. දියෙහි ගිලුණු අයකුට ප්‍රථමාධාර දීමේ දී පළමුවෙන් ම කළ යුතු වන්නේ කුමක් ද?
    1. තෙත ඇඳුම් ඉවත් කිරීම.
    2. පොරවනයක් මගින් ශරීරයේ උණුසුම ආරක්ෂා කිරීම.
    3. හොඳින් හුස්ම ගන්නේ දැයි පරීක්ෂා කිරීම.
    4. උණු පානයක් ලබා දීම.

19. පාචනය රෝගය ඇති කරන්නේ

    1. ගෙමැස්සාය  2. මකුළුවා ය  3. මදුරුවා ය  4. කුරුමිණියා ය

20. සුළු පිළිස්සීමක දී භාවිත කෙරෙන ඖෂධීය ශාකයකි
    1. රණවරා  2. පාවට්ටා  3. හාතාවාරිය  4. කෝමාරිකා

21. අකුණු ගහන අවස්ථාවක ආරක්ෂාවීමට වඩාත් ම සුදුසු ක්‍රමය වන්නේ

    1. ගසක් යටට වී සිටීම ය.  2. ජලාශයකට බැස සිටීම ය.

    3. ගෙතුළ ඇඳක් මත සිටීම ය.  4. තැනිතලා බිමක ඇවිදීම ය.

22. උසකින් වැටී ඉල ඇට බිඳීමකට පත් වූ පුද්ගලයෙකු සඳහා වහාම කළ යුතු ප්‍රථමාධාරය වන්නේ
    1. ශරීරයේ අනතුරකට ලක් වූ ස්ථානය රෙදි පටියකින් බැඳීම ය.
    2. ශරීරයේ අනතුරකට ලක් වූ ස්ථානය පිරිසිදු ජලයෙන් සේදීම ය.
    3. පුද්ගලයා නොසෙල්වෙන සේ සමතලා ස්ථානයක තැබීම ය.
    4. උණු පානයක් ලබා දීම ය.

23. අපිරිසිදු ජලය පානය කිරීම නිසා වැළඳෙන රෝගයකි

    1. සෙම්ප්‍රතිශ්‍යාව  2. කක්කල් කැස්ස  3. කම්මුල්ගාය  4. සෙංගමාලය

24. මදුරුවන් මගින් බෝවෙන රෝගයකි

    1. පාචනය  2. මැලේරියාව  3. කොළරාව  4.උණසන්නිපාතය

25. දියවැඩියා රෝගය පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු ආහාරය වන්නේ ,
    1. පාන් ය  2. නූඩ්ල්ස් ය  3. කව්පි ය  4. මඤ්ඤොක්කා ය

26. මදුරුවන් මර්දනය කිරීම සඳහා පහසු මෙන්ම වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
    1. නිවසේ සිටින මදුරුවන් විනාශ කිරීම ය.
    2. මදුරු බිත්තර විනාශ කිරීම ය.
    3. මදුරු කීටයන් විනාශ කිරීම ය .
    4. අවට පරිසරයේ ජලය එක්රැස් වීමට ඉඩ නොතැබීම ය.

27. බෝවන රෝගයක් (ප්‍රදේශය පුරා)පැතිර යන අවස්ථාවක දී වහාම දැනුම් දිය යුත්තේ කාට ද?
    1. පොලිස් ස්ථානාධිපතිවරයාට  2. රෝහලේ වෛද්‍ය නිලධාරීවරයාට
    3. විදුහල්පතිවරයාට  4. මහජන පරීක්ෂක තුමාට

28. භූමිකම්පාවක දී වහාම කළ යුතු වන්නේ ,
    1. තමා සිටින ස්ථානයේ ම සිටීම  2. ගසක් යටට යාම ය
    3. උස් ගොඩනැගිල්ලකට යාම ය  4. විවෘත ස්ථානයකට යාම ය

29. මහාමාරිය රෝගය බෝවන්නේ ,

1. මදුරුවාගෙනි 2. මීයාගෙනි 3. මැස්සාගෙනි 4. කුකුළාගෙනි

30. ඩෙංගුරෝගය සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

1. ඕනෑම මදුරුවෙකුගෙන් ඩෙංගු රෝගය බෝවිය හැක.
2. ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වළක්වාගත හැකි ය.
3. ඩෙංගු රෝගය සුව කළ හැකි ය.
4. ඩෙංගු රෝගය හේතුකොට ගෙන මරණයට ද පත් විය හැකි ය.

31. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝගයක් වන්නේ,

1. මැලේරියාව ය 2. ක්ෂය රෝගය ය 3. මී උණ ය 4. සෙංගමාලය ය

32. සර්පයෙකු දෂ්ට කළ වහාම ලබාදෙන ප්‍රථමාධාරයක් වන්නේ කුමක් ද?

1. පිරිසිදු වාතාශ්‍රය ලැබෙන්නට සැලැස්වීම.
2. තද ඇඳුම් බුරුල් කිරීම.
3. දෂ්ට කළ ස්ථානය සබන් ගා ඇල් වතුරෙන් සේදීම.
4. රෝගියාගේ දෙපා අඩියක් පමණ එසවෙන සේ දිගා කරවීම.

33. ස්වාභාවික අනතුරකි

1. ගසකින් වැටීම 2. අකුණු සැර වැදීම
3. ආහාර විෂ වීම 4. බල්ලකු සපා කෑම

34. නාය යාම සිදුවිය හැකි ප්‍රදේශයකි

1. කොළඹ 2. යාපනය 3. රත්නපුර 4. පුත්තලම

35. අකුණු සැර වැදීමට හේතුවක් **නොවන්නේ ,**

1. අකුණු සහිත අවස්ථාවක දී රූපවාහිනිය නැරඹීම.
2. අකුණු සහිත අවස්ථාවක දී නිවස තුළ ඇඳක් මත සිටීම.
3. අකුණු සහිත අවස්ථාවක දී දුරකථන භාවිතය.
4. අකුණු සහිත අවස්ථාවක දී එළිමහනේ රැඳී සිටීම.

36. ඖෂධ භාවිතයේ දී සැලකිලිමත්විය යුතු කරුණකි,

1.ඖෂධ මිලට ගන්නා ඔසුසල. 2. ඖෂධයේ මිල.
3.වෛද්‍ය උපදෙස්. 4. ඖෂධ අසුරණයේ ස්වභාවය.

37. මිනිසෙකුගේ පාදයට සර්පයෙක් දෂ්ට කළ විට ඉක්මනින් ම සිදු කළ යුතු වන්නේ ,

1. සර්පයා දෂ්ට කළ පාදය රෙදි පටි මගින් තදින් වෙළීම.
2. රෝගියා හාන්සි කර පවන් සැලීම.
3. දියර වර්ග පානය කිරීමට නොදීම.
4. ගලා යන පිරිසිදු ජලයෙන් තුවාලය සබන් යොදා සේදීම.

38. පන්තියේ තිබෙන ප්‍රථමාධාර පෙට්ටියේ **නොතිබිය** හැකි දෙයකි.

1. කතුර. 2. වෙළුම් පටි. 3. වෙද නළාව. 4. ප්ලාස්ටර්

39. ඖෂධ අසුරනයක දැකිය නොහැකි දෙයකි.

1. මිල　2. ඖෂධයේ නම　3. මාත්‍රාව　4. ඔසුසලේ නම

40. බල්ලෙකු සපා කෑ  වහාම සිදු කළ යුත්තේ කුමක් ද?

1. බල්ලා සපා කෑ ස්ථානය රෙදි පටි මඟින් තදින් වෙළීම.
2. ගලා යන පිරිසිදු ජලයෙන් තුවාලය සබන් යොදා සේදීම.
3. දියර වර්ග පානය කිරීමට නොදීම.
4. රෝගියා හාන්සි කර පවන් සැලීම.

41. භූමිකම්පාවක දී අප කළ යුතු දෙයක් වන්නේ,

1. විවෘත ස්ථානයකට යාම.　2. උස් ස්ථානයකට යාම.
3. නිවස තුළට වී සිටීම.　4. ගසක් යටට දිවීම.

42. නිවස තුළ ඖෂධ ගබඩා කළ යුත්තේ,

1. නිවසේ සියලු දෙනාට පහසුවෙන් ගත හැකි ස්ථානයක තැබීම.
2. ඉතා උණුසුම් ස්ථානයක තැබීම.
3. කුඩා දරුවන්ට හසු නොවන සේ තැබීම.
4. තෙත් ස්ථානයක තැබීම.

43. යම් පුද්ගලයෙකුට හදිසි රෝගී තත්ත්වයක් මතුවූ විට ගිලන් රථයක් ගෙන්වා ගැනීමට ඇමතිය යුතු දුරකථන අංකය වන්නේ,

1. 1919　2. 1990　3. 1929　4. 119

44. නිවසේ දී උණු වතුර කේතලය පෙරළී ගීතාගේ අත පිලිස්සුණි. මේ අවස්ථාවේ දී කළයුතු දෙයක් වන්නේ ,

1. දන්තාලේප ආලේප කිරීම.
2. පිලිස්සුණු ස්ථානය ආවරණය කිරීම.
3. පිලිස්සුණු ස්ථානයට ගලා යන සේ ජලය දැමීම.
4. රෝගියාට පවන් සැලීම.

45. ක්‍රීඩාපිටියේ දී සිදුවිය හැකි අනතුරක් වන්නේ,

1.රිය අනතුරු.　2. දිවීමේ දී වැටීම.　3. දියේ ගිලීම.　4. ගසකින් වැටීම.

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 8. ජලය |
|---|---|---|

සැකසුම :- එස්.ඩී.එස්.පී. සියඹලාපිටිය
අ/ අඟුනොච්චිය විදුහල

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1. පහත සඳහන් ද්‍රව්‍ය අතුරින් ඇසුරෙන් ජලයේ පාවෙන ද්‍රව්‍යයක් වන්නේ.
   (1). ගඩොල් කැටය (2). සීනි (3). පොල්තෙල්
2. ජලය පිරිසිදු කිරීමට අතීතයේ යොදා ගත්තේ මින් කුමක්ද?.
   (1). ක්ලෝරීන් (2). ඉඟිනි ඇට (3). ලුණු
3. ජල වාෂ්ප වලින් තම්බාගනු ලබන ආහාරයක් නොවන්නේ.
   (1). ආප්ප (2). ඉඳිආප්ප (3). වණ්ඩු
4. මෙම ක්‍රියාකාරකම් මගින් අපට නිගමනය කළ හැක්කේ
   (1). ජලය ගලායන බව
   (2). ජලය රත්වීමේ දී වාෂ්ප වන බව
   (3). ජලය ඝන බවට පත්වන බව



5. අපට ජලය ලැබෙන ප්‍රධාන ක්‍රමය වන්නේ
   (1). නළළිඳ (2). ගංගාව (3). වැස්ස (4). මුහුද
6. ජලයේ දිය කළ විට දිය වී නොපෙනී යන්නේ.
   (1). සීනි (2). නිල් (3). කහකුඩු (4). කොන්ඩිස්
7. ජලයේ ඝන අවස්ථාව හඳුන්වන්නේ කෙසේද?
   (1). වාෂ්ප (2). ඇල් ජලය (3). අයිස්
8. ජලය වේගයෙන්ම ගලා යන්නේ
   (1). ගංගාවේ (2). වැවේ (3). දිය ඇල්ලේ (4). මුහුදේ
9. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳෙන රෝගයක් නොවේ.
   (1). උණසන්නිපාතය (2). පාචනය (3). ජලභීතිකාව
10. ජලයේ ගුණාංගයක් වන්නේ
    (1). පාටක් ඇත (2). හැඩයක් ඇත
    (3). රත් කළ විට වාෂ්ප වේ (4). එක තැනක රඳා පවතී
11. අයිස් කැටයක් ජලයට දැමූ විට
    (1). පතුලේ ගිලෙයි (2). කැබලි වලට කැඩෙයි
    (3). දිය වෙයි (4). වෙනසක් නොවේ.
12. ජල වාෂ්පයෙන් තම්බා ගන්නා ආහාරයකි.
    (1). බත් (2). කඩල (3). පිට්ටු (4). ආප්ප
13. පොල් තෙල් සමඟ කලවම් කළවිට මිශ්‍ර වන දෙයක් වන්නේ
    (1). ජලය (2). වර්ෂා ජලය (3). තල තෙල් (4). උණු ජලය

14. මෙම උපකරණය වන්නේ



(1). සුළං දිශා දර්ශකය
(2). අනිලමානය
(3). ජල රෝදය

15. අයිස් කැටයක් ජලයට දමා ටික වේලාවකින් සිදුවන්නකි.
(1). පා වීම (2). ජලයේ ගිලී යෑම
(3). ක්‍රමයෙන් දියවී යෑම (4). කිසිවක් සිදු නොවේ.

16. ජලයේ ස්වභාවය අනුව බෙදා ඇති අවස්ථා ගණන.
(1) 5 කි (2). 10 කි. (3). 2 කි. (4). 3 කි.

17. අයිස් කැටයක් ජලයට දැමූ විට සිදු නොවන්නේ කුමක්ද?.
(1). අයිස් කැටය ජලයේ දියවීමයි (2). අයිස්.කැටය ජලයේ පාවීමයි
(3). ජලයේ වර්ණය වෙනස් වීමයි. (4). ජලය සීතල වීමයි.

18. කොන්ඩිස් කුඩු ජලයට එකතු කළ විට ලැබෙන දියරයේ පාට කුමක් ද?.
(1). රතු (2). කහ (3). දම් (4). කොළ

19. නිල් කුඩු ජලයට දැමූ විට
(1). කැටි ගැසේ (2). උඩ පාවේ (3). දිය වේ.

20. ආඩියා ළිං දැකිය හැක්කේ.
(1). යාපනයේ (2). ගාල්ලේ (3). නුවර

21. අයිස් කැටයක් ජලයට දැමූ විට දැකිය හැකි නිවැරදි ආකාරය වන්නේ.

1. 2. 3. 4.



22. ජලය පිරිසිදු කර ගැනීමට යොදා ගන්නා රසායනික ද්‍රව්‍යයක් වන්නේ
(1). අඟුරු (2). ඉඟිනි ඇට (3). ක්ලෝරීන් (4). ලුණු

23. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළදෙන රෝගයක් නොවන්නේ
(1). පාචනය (2). සෙංගමාලය (3). කොලරාව (4). ඩෙංගු

24. ජලයේ පාවෙන දෙයක් වන්නේ
(1). පැන්සල (2). යකඩ ඇණය (3). ගල් කැටය (4). ටීක් බෝල

25. ජලය අඩුවෙන් පානය කිරීමෙන් දැනෙන අපහසුවක් නොවේ.
(1). හම වියළීම (2). මුත්‍රා කිරීමේ පහසුව (3). උගුරකට වියළීම.

26. අපිරිසිදු ජලය පානය කිරීමෙන් සෑදිය හැකි රෝගයකි.
(1). සෙංගමාලය (2). දියවැඩියාව (3). ගලගණ්ඩය

27. ජලයට දමා දිය කළ විට හොඳින් දිය වෙන ද්‍රව්‍යයක් නොවන්නේ
(1). ලුණු (2). සබන් (3). සීනි (4). පොල්තෙල්

28. ජලය දූෂණයට ලක්විය හැකි සිදුවීමක් විය හැක්කේ.
(1). දිය උල්පත් ජලය නිසා (2). ළිං නොකැපීම.
(3). වර්ෂා ජලය නිසා (4). අපද්‍රව්‍ය ජලයට එක් කිරීම.

29. ලෝක ජල දිනය යෙදී ඇත්තේ
(1). මාර්තු 22 (2). ජුනි 05 (3). ජුනි 22

30. අයිස් කැටයක් ජලයට දැමූ විට පළමුවෙන්ම.
(1). අයිස් කැටය පාවේ. (2). ජලය සීතල වේ. (3). අයිස් කැටය දිය වේ.

31. ඕනෑම පුද්ගලයෙකුගේ ශරීරයෙන් ජලය පිටවන ප්‍රධාන ක්‍රම 02 දැක්වෙන පිළිතුර වන්නේ.
(1). ආශ්වාස හා ප්‍රශ්වාසය මඟින් (2). මූත්‍රා හා කඳුළු ලෙස
(3). දහඩිය හා මූත්‍රා ලෙස

32. කේතලයකින් ජලය උතුරා වාෂ්ප වනවිට හඳුන්වන නම කුමක් ද?.
(1). අයිස් (2). උණු ජලය (3). හුමාලය

33. ජලය පිළිබඳව ඇති නිවැරදි ප්‍රකාශය වන්නේ
(1). නිශ්චිත හැඩයක් නැත. (2). සුවඳක් ඇත. (3). නිශ්චිත පාටක් ඇත.

34. ජලයේ අවස්ථාවක් නොවේ.
(1). ඝන (2). ද්‍රව (3). සිසිල් (4). වායු

35. කේතලයක් ලිප තබා වතුර රත් කරන විට එහි කෙණ්ඩියෙන් පිටවන ජලය හඳුන්වන්නේ.
(1). වාෂ්ප (2). වාතය (3). ද්‍රාවක

36. ජලයට දමා පෙගෙන්නට හැරිය විට ප්‍රමාණයෙන් විශාල වන ද්‍රවයකි.
(1). ලුණු (2). පාන් (3). බත්

37. ජලයට දැමූ විට වායු බුබුළු පිටවන ද්‍රව්‍ය කුමක්ද?.
(1). ගල් කැබලි (2). විදුරු කැබලි (3). පස්

38. ජලයට දැමූ විට ජලයේ මතුපිට පා නොවන දියර වර්ගයක් වන්නේ.
(1). පෙට්ර ල් (2). විනාකිරි (3). භූමිතෙල්

39. පිරිසිදු ජලය සතු ගුණාංගයක් නොවන්නේ
(1). රසයක් නැත. (2). පාටක් නැත
(3). වාෂ්ප නොවේ. (4). ගඳක් නැත.

40. නාගරික පෙදෙස්වල ජලය ලබාගන්නා ජල මූලාශ්‍රයක් වන්නේ,
(1). වැව (2). අඬියා ළිඳ (3). නළ ජලය

41. ජල විදුලිබලාගාරයක් පිහිටි ස්ථානයකි.
(1). කොත්මලේ (2). රුමස්සල (3). පොළොන්නරුව

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 9. ගමනාගමනය |
|---|---|---|

සැකසුම :- ඒ.එච්. රාධා ප්‍රබෝධනි
අ/ කල්පේ රළපනාව විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සිතියම්වල මහා මාර්ග දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය කුමක් ද?
   1. කළු, 2. නිල් 3. කොළ 4. රතු

2. නිල්පාට පුවරුවක සුදුපාට ත්‍රිකෝණයක් තුළ පෙන්වා ඇති පහත මාර්ග සංඥාවෙන් ප්‍රකාශ වන්නේ,



   1. ඉක්මනින් පාර පනින්න.
   2. පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙන්
   3. පාර පැනීම තහනම්
   4. පදිකයන් මාරුවන ස්ථානය

3. බස්නැවතුමක නතර කළ බස්රියකින් බැසගත් මගියෙකු බසය ඉදිරියෙන් පාර හරහා පැනීම අනතුරුදායක වන්නේ
   1. දකුණු පසින් එන වාහන පැහැදිලිව නොපෙනන නිසා ය.
   2. වම් පසින් එන වාහන පැහැදිලිව නොපෙනන නිසා ය.
   3. මාර්ගයේ දෙපැත්තම පැහැදිලිව නොපෙනෙන නිසා ය.
   4. බස්රියේ රියදුරුට මගියා නොපෙනෙන නිසා ය.

4. කහපාට පසුතලයක දැක්වෙන මෙම මාර්ග සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?



   1. ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි.
   2. පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙනි.
   3. ඉක්මනින්ම පාර පනින්න
   4. පදිකයන් මාරුවන ස්ථානය

5. බයිසිකලයක පිටුපස මඩ ආවරණයේ පහළ කොටසේ රතු පැහැති පරාවර්තනයක් (ටේල් ලයිට් එකක්) තිබීම අත්‍යවශ්‍යය වන්නේ,
   1. රාත්‍රි කාලයේ පයින් ගමන් කරන අයගේ ආරක්ෂාව සඳහා ය
   2. රාත්‍රි කාලයේ පාර හරහා පයින් යන අයගේ ආරක්ෂාව සඳහා ය
   3. රාත්‍රි කාලයේ දී පසු කරනු ලබන පයින් ඇවිදින්නන්ට පෙනීම සඳහා ය.
   4. රාත්‍රි කාලයේ දී පිටුපසින් එන වාහනවල පෙනීම සඳහා ය.

6. කහපාට පසුබිම දැක්වෙන මෙම මාර්ග සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?



   1. ඉදිරියෙන් නවතිනු
   2. ගේට්ටුව සහිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි
   3. ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි
   4. මාර්ගය ඉදිරියෙන් වසා ඇත.

7. රූප සටහටන් දැක්වෙන පොලිස් නිළධාරියා ලබාදෙන සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?



1. පිටුපසින් එන වාහන පමණක් නතර වෙනු.
2. ඉදිරියෙන් සහ පිටුපසින් එන සියලුම වාහන නතර වෙනු.
3. ඉදිරියෙන් එන වාහන පමණක් නතර වෙනු.
4. ඉදිරියෙන් සහ පිටුපසින් එන සියලු ම වාහන නොනවත් වනුය.

8. ගමනාගමනය සඳහා වැඩිවශයෙන් පාපැදි භාවිතට හා සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
1. පරිසර දූෂණය අඩු කර ගත හැකිය.
2. ගමනාගමන වියදම් අඩු කර ගත හැකිය.
3. අනතුරු අඩු කර ගත හැකි ය.
4. ලෙඩ රෝග අඩු කර ගත හැකි ය.

9. මෙම සංකේතයෙන් ප්‍රකාශ වන්නේ,



1. ගැබිණි මව්වරුන් සඳහා බව
2. අබාධිත අය සඳහා බව
3. වයස්ගත වූවන් සඳහා බව
4. ළමයින් සඳහා බව

10. රාජ්‍ය ආයතනවලින් සැපයෙන සේවා හා සම්බන්ධ තොරතුරු දැනගැනීම සඳහා ඇමතිය යුතු දුරකථන අංකය

| | | | |
|---|---|---|---|
| 1. 118 වේ | 2. 119 වේ. | 3. 1231 වේ | 4. 1919 වේ. |

11. ලියාපදිංචි තැපෑලෙන් මෙරට තුළ ලිපියක් යැවීම සඳහා කොපමණ වටිනාකමින් යුත් මුද්දර අඩුම වශයෙන් අවශය වේ ද?

| | | | |
|---|---|---|---|
| 1. රු. 20.00 | 2. රු. 25.00 | 3. රු. 30.00 | 4. රු. 35.00 |

12. මෙම රූපික ප්‍රකාශයෙන් අදහස් වන්නේ,



1. '' වටරවුමක් '' යන්නයි
2. '' ප්‍රතිචක්‍රීකරණය කළ යුතු ය'' යන්නයි.
3. '' දකුණට හැරවිය යුතු ය''යන්නයි.
4. '' පරෙස්සමෙන් පරිහරණය කරන්න'' යන්නයි.

13. කහපාට පසුබිමෙන් කළුපාටින් ඇති මෙම මාර්ග සංඥාවෙන් කියවෙන්නේ,



1. පදිකයන් මාරුවන ස්ථානය ඉදිරියෙනි යන්නයි
2. අනතුරු සහිත වංගුව ඉදිරියෙනි යන්නයි
3. වැඩ කරන මිනිසුන් ඉදිරියෙනි යන්නයි
4. ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි යන්නයි.

14. කොළඹ සිට බදුල්ල දක්වා වැටී ඇති දුම්රිය මාර්ගයේ හමුවන දුම්රිය නැවතුපොළකි,

| | | | |
|---|---|---|---|
| 1. වටවල | 2. හබරණ | 3. සීදුව | 4. වව්නියාව |

15. ඉන්ධන අවශ්‍ය නොවන ප්‍රවාහන ක්‍රමයක් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. රුවල් ඔරුව | 2. කෝච්චිය | 3. නැව | 4. ගුවන්යානය |

16. කහපාට පසුබිමෙහි කළු පාටින් ඇති මෙම රූපයෙන් දැක්වෙන මාර්ග සංඥාව කුමක් ද?



1. ගේට්ටුව සහිත දුම්රිය මාර්ගය
2. ගේට්ටුව රහිත දුම්රිය මාර්ගය
3. ආරක්ෂාකර ඇති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි
4. ආරක්ෂා කර නොමැති දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි

17. ශ්‍රී ලංකාවේ දකුණු දුම්රිය මාර්ගයේ අවසාන නගරය වනුයේ,

1. මාතර 2. ගාල්ල 3. බෙලිඅත්ත 4. කතරගම

18. කහපාට පසුබිමෙහි කළු පාටින් ඇති මෙම රූපයේ දැක්වෙන සංඥාව කුමක් ද?



1. රෝහල ඉදිරියෙනි
2. පටු පාලම ඉදිරියෙනි
3. එකිනෙක හරහා ගමන් කරන මාර්ගය ඉදිරියෙනි
4. ඉදිරියේ දී මාර්ගය පටුය

19. මාර්ග සිතියම්වල නිල් පාටින් පෙන්වා ඇති පහත රූපයෙන් පෙන්වන්නේ




1. අධිවේගී මාර්ග
2. මහා මාර්ග
3. දුම්රිය වර්ග
4. ඇල මාර්ග

20. අධිවේගී මාර්ගවල තොරතුරු පුවරුවල වර්ණය වන්නේ,

1. නිල් 2. කොළ 3. රතු 4. සුදු

21. කහපාට පසුබිමෙහි කළුපාටින් ඇති මෙම රූපයේ දැක්වෙන සංඥාව කුමක් ද?



1. මාර්ගය වසා ඇත.
2. ඉදිරියෙන් නවතිනු
3. වටරවුම් ඉදිරියෙනි
4. ඉදිරියෙන් මාර්ගය ඉඩදෙනු

22. මහමග සිටුවා ඇති තැපැල් පෙට්ටි කණුවල ඇති පාට වන්නේ,

1. නිල් 2. කොළ 3. රතු 4. කහ

23. සිතියමක දුම්රිය මාර්ග දක්වන වර්ණය වනුයේ,

1. සුදු 2. කළු 3. තැඹිලි 4. නිල්

24. මෙම මාර්ග සංඥාවෙන් කියවෙන්නේ,



1. ඉදිරියට යන්න
2. ඉදිරියෙන් දකුණට හරවන්න.
3. ඉදිරියෙන් මාර්ගය වසා ඇත.
4. ඇතුළුවීම තහනම්

25. ''දෝලාව'' භාවිත කරන්නේ,

1. ජලයේ පාවීමට 2. ගමන් යෑමට
3. පණිවිඩ යැවීමට 4. කාලය මැනීමට

26. පොදු ප්‍රවාහන ක්‍රමවල ආසන වෙන්කර නොමැත්තේ,
   1. ගැබිනිමව්වරුන්ට   2. අබාධිතයන්ට
   3. පූජ්‍ය පක්‍ෂයට   4. හමුදා නිළධාරින්ට

27. තැපැල් පෙට්ටියක සටහන් කර ඇති දෙයකි,
   1. විවෘත කරන්නාගේ නම   2. ලිපියකට තිබිය හැකි අවම බර
   3. ලිපි ගන්නා වේලාව   4. ලිපි ගන්නා දිනය

28. වැවක් පිහිටන ස්ථානයක් සලකුණු කිරීමට ශ්‍රී ලංකා සිතියම්වල යොදා ගන්නේ,
   1. නිල් පාට දිග රේඛාවකි.
   2. නිල් පාට රේඛාවක් මත යෙදූ තිතකි.
   3. නිල්පාටින් පාට කළ කුඩා ප්‍රදේශයකි.
   4. එක් ස්ථානයකට සම්බන්ධ කළ නිල්පාට රේඛා කිහිපයකි.

29. ශ්‍රී ලංකාව තුළ පොදු වාහන මගින් සිදු කෙරෙන ගමනාගමන සේවය මහජනතාවට වඩාත් හිතකර සේවයක් වීම සඳහා පහත කුමන යෝජනාව ක්‍රියාත්මක කිරීම වඩාත් සුදුසු වේ ද?
   1. නියමිත කාල සටහනකට අනුව සියලු ම පොදු වාහන ක්‍රියාත්මක කිරීම
   2. පොදු වාහන තුළ රූපවාහිනි හා ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම
   3. දහවල් කාලය තුළ පොදු වාහන ධාවනය සීමා කිරීම
   4. ධාවනය කිරීමේ දී නැවතුම් ස්ථාන කිහිපයක පමණක් පොදු වාහන නතර කිරීම

30. ''ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට කන්නේ කරවලයි රට හාලේ බතට'' යන කවිය
   1. ගොයම් කවියකි,   2. කරත්ත කවියකි   3. පාරු කවියකි   4. පතල් කවියකි.

31. අපේ රටේ පොදු ප්‍රවාහන බස් රථයක පූජ්‍ය පක්ෂයට හැරුණු විට මගී ආසන වෙන්කර ඇති අනෙක් පුද්ගල දෙක මොනවා ද?
   1. ළදරුවන්, රෝගීන්   2. රෝගීන්, පාසල් දරුවන්
   3. අබාධිතයින්, ගැබිනි මව්වරුන්   4. වයස්ගත වැඩිහිටියන්, අබාධිතයින්

32. මාර්ග වර්ණ සංඥා පුවරුවක ඉහළ සිට පහළට වර්ණ සංඥා පිහිටන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
   1. රතු, කහ, කොළ   2. කොළ, කහ, රතු
   3. කහ, රතු, කොළ   4. කහ, කොළ, රතු,

33. ගමනාගමනය සඳහා අවම වියදමක් දැරීමට සිදුවන වාහනය වන්නේ,
   1. යතුරු පැදිය   2. තුන්රෝද රිය   3. පා පැදිය   4. කාරය

34. වැඩිම වේගයකින් ගමන් කළ හැකි වාහනය වන්නේ,
   1. කාරය   2. නැව   3. දුම්රිය   4. ගුවන්යානය

35. මහා මාර්ගයේ ගමන් කරන පොදු වාහනයක් වන්නේ,
   1. කාරය   2. බසය   3. ත්‍රීවීලරය   4. ලොරිය

36. මහාමාර්ගයේ ගමන් කරන මගීන් පයින් ගමන් කරන විටක එක පෙළට ගමන් කළ යුතු වැඩිම මගීන් සංඛ්‍යාව වන්නේ,
   1. දෙදෙනෙකි   2. තිදෙනෙකි   3. හතර දෙනෙකි   4. පස් දෙනෙකි

37. මෙම රූපික ප්‍රකාශනයෙන් කියවෙන්නේ කුමක් ද?




1. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
2. මාර්ග සංවර්ධන අධිකාරිය
3. ලංකා විදුලිබල මණ්ඩලය
4. ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

38. මහාමාර්ගයේ ඇති විදුලි සංඥා පුවරුවක රතුපාට එළිය දැක්වීමෙන් සංඥා කෙරෙන්නේ,
1. රථය ධාවනය කරන්න යන්නයි.
2. රථය නවත්වන්න යන්නයි.
3. රථය ධාවනයට සූදානම්වන්න යන්නයි
4. රථය දකුණට හරවන්න යන්නයි.

39. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල පිහිටා ඇත්තේ,
1. කටුනායක 2. මත්තලය 3. රත්මලානේ ය. 4. වීරවිල ය.

40. ශ්‍රී ලංකා සිතියමක අභය භූමි සලකුණු කර ඇත්තේ කිනම් වර්ණයකින් ද?
1. කළු 2. කොළ 3. රතු 4. නිල්

41. පළල් මාර්ගය පෙන්නුම් කිරීමට භාවිත කෙරෙන රූපික ප්‍රකාශනය කුමක් ද?

1.

2.

3.

4.



42. පොදු ප්‍රවාහන සේවාවක්වන බස්රථවල ආසන වෙන්කර ඇත්තේ,
1. පූජ්‍ය පක්ෂය, ගැබිණි මාතාවන්, වැඩිහිටි අය සඳහා ය.
2. පූජ්‍ය පක්ෂය, ගැබිණි මාතාවන්, ආබාධිත අය සඳහා ය.
3. ගැබිණි මාතාවන්, පූජ්‍ය පක්ෂය, කුඩා දරුවන් වඩාගෙන එන අය සඳහා ය.

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 10. ගෙවත්ත

සැකසුම :- කේ. සී. ගුණතිලක
අ/ අඟුනෝච්චිය විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පලතුරු වගාවට බෙහෙවින් හානිකරන සතෙකු වන්නේ
   1. කැරපොත්තා 2. පිටි මකුණා 3. දළඹුවා 4. මකුළුවා

2. බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම යොදා ගැනීමේ ඇති වාසියක් නොවන්නේ,
   1. පහසුවෙන් සාත්තු සප්පායම් කළ හැකි වීමයි.
   2. අව්වැසි ආදියෙන් ආරක්ෂා කර ගැනීමට හැකි වීමයි.
   3. අවශ්‍ය විට එහා මෙහා කළ හැකි වීමයි.
   4. ඉඩකඩ ඇති තැන්වල පමණක් වගා කළ හැකි වීමයි.

3. ගෙවත්තේ බෝග වගාවට හානි කරනු ලබන කෘමි පැමිණීම වළක්වාලීමට වගා කරන ශාකයක් වන්නේ,
   1. මදුරුතලා ය. 2. ගඳපාන ය. 3. පැඟිරි ය. 4. දාස්පෙතියා ය.

4. අතු කැබලි සිටුවීමෙන් පැළ ලබාගත හැකි බෝග වර්ගය කුමක් ද?
   1. මිරිස් 2. මෑ 3. කංකුං 4. අර්තාපල්

5. ගෙවතු වගාවේ දි භාවිත කෙරෙන උපකරණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
   1. උදැල්ල, මුල්ලුව හා ලඹය 2. මයිනහම, නගුල හා රේක්කය
   3. යතු කැටය, උදැල්ල හා රේක්කය 4. උදැල්ල, මුල්ලුව හා රේක්කය

6. පස සාරවත් කිරීමට උදව් කරන සතෙකු වන්නේ,
   1. පත්තෑයා ය. 2. කුඩිත්තා ය. 3. ගැඩවිලා ය. 4. හැකරැල්ලා ය.

7. බෝග වගාවේ දි ගොවියාට උපකාරවත් වන සතෙකු වන්නේ,
   1. මී මැස්සා ය. 2. කුඩිත්තා ය. 3. ගෙමැස්සා ය. 4. ගොළුබෙල්ලා

8. වගාවට හානි කරන සත්ත්ව විශේෂයක් නොවන්නේ,
   1. පැලමැක්කා ය. 2. කුඩිත්තා ය. 3. පුරුක්පණුවා ය. 4. ගෙම්බා ය.

9. රෝපණය කිරීමට සුදුසු බීජයක ලක්ෂණයක් වන්නේ,
   1. නොමේරූ බීජයක් වීම ය. 2. පිට පොත්ත පැල්ලම් රහිතව දීප්තිමත් වීම ය.
   3. තුවාල වීම ය. 4. බීජ අව පැහැ වීම ය.

10. තවාන් කර පැළ ලබා ගැනෙන බෝග වර්ගයකි.
    1. බතල 2. කංකුං 3. මිරිස් 4.පතෝල

11. පරිසර හිතකාමී කෘමිනාශකයක් සකස්කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය වූ බීජ වර්ගයකි.
    1. ගස්ලබු ඇට 2. කොහොඹ ඇට 3. එඬරු ඇට 4. දඹල ඇට

12. කරල් හට ගන්නා ගසකි.
    1. මෑ 2. දඹල 3. බණ්ඩක්කා 4. බෝංචි

13. කොම්පෝස්ට් පොහොර සෑදීමට යොදා ගත හැකි ද්‍රව්‍ය කි.
1. පොලිතීන් 2. කොළ රොඩු 3. ටින් 4. වීදුරු කැබලි

14. ඉවත දමන භාජනයක් බෝග වගාවට යොදා ගෙන ඇති ආකාරය රූපයේ දැක් වේ. මෙම විකල්ප ක්‍රමය පිළිබඳව පහත සඳහන් කුමක් නිවැරදි ද?



1. සාත්තු කිරීමට අපහසු ය.
2. එකම ස්ථානයක තබා වගා කල යුතු ය.
3. සත්තුන්ගෙන් ආරක්ෂා කර ගැනීම අපහසු ය.
4. ඉඩකඩ සීමා වූ තැන්වල බෝගවලට සුදුසු ය.

15. තවාන් පැළ ලබාගෙන පාත්තිවල සිටුවනු ලබන බෝග වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. බෝංචි, බණ්ඩක්කා, නිවිතිය 2. බෝංචි, තක්කාලි, මාළු මිරිස්
3. වම්බටු, නිවිතිය, තක්කාලි 4. මාළුමිරිස්, වම්බටු, තක්කාලි

16. බීජයක් පැළවීමේ දි මුලින් ම දක්නට ලැබෙන්නේ,
1. මුල 2. පත්‍ර 3. කඳ 4. දල්ල

17. පාසල් වත්තේ මිරිස් පාත්තියක් සකස් කිරීමට තෝරාගත යුත්තේ
1. හිරු එළිය අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරළු සහිත බිමකි.
2. බොරළු සහිත ජලය බැස යන තැනිතලා බිමකි.
3. හිරු එළිය හොඳින් ලැබෙන ජලය බැස යන බොරළු රහිත තැනිතලා බිමකි.
4. හිරු එළිය ඉතා අඩුවෙන් ලැබෙන විශාල ගස් ඇති බොරළු රහිත තැනිතලා බිමකි.

18. කාබනික පොහොර වර්ගයක් නොවන්නේ,
1. එළු පොහොර 2. ගොම 3. යූරියා 4. කොළ රොඩු

19. ඉක්මනින් පැළවෙන බීජ කාණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මිරිස්, අබ, මුං 2. මිරිස්, අඹ, කුඩළු
3. මුං, පුවක්, දාස්පෙතියා 4. පොල්, තක්කාලි

20. හේන් ගොවියා අස්වැන්න නෙලාගත් පසු දෙනු ලබන දානයක් වනුයේ.
1. දේව දානය 2. උපාසක දානය
3. බලු කපුටු දානය 4. මතක දානය

21. ගෙවත්තක දක්නට ලැබෙන අංගයක් නොවන්නේ
1. මල් පාත්ති 2. ගේට්ටුව 3. දඬුවැට 4. කාණු පද්ධතිය

22. ගෙවත්තක වල් පැළ ඉවත් කිරීමට යොදා ගන්නා ක්‍රමයක් නොවන්නේ
1. අතින් ගලවා දැමීම 2. වීසි ගැසීම 3. අතු ගෑම 4. උදළු ගෑම

23. පාත්තිවල සිටුවන බෝග පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. මිරිස්, බණ්ඩක්කා, බටු 2. බණ්ඩක්කා, මෑ , වැටකොළු
3. මිරිස් , බටු , තක්කාලි 4. දඹල, තක්කාලි , කරවිල

24. බෝග වගාවට හානි නොකරන සතුන් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. බත්කූරා, පළගැටියා 2. බකමූණා, ගොළුබෙල්ලා
3. සමනළයා, මී මැස්සා 4. ගැඩවිලා, දළඹුවා

25. වගා බදුනකට සමාන ප්‍රමාණයෙන් යොදා ගත යුතු දේ වනුයේ
   1. ගඩොල් කැබලි ,වැලි ,මතුපිට පස්
   2. කාබනික පොහොර, වැලි ,මතුපිට පස්
   3. පොල් ලෙලි ,ගඩොල් කැබලි ,වැලි
   4. පොල් ලෙලි, මතුපිට පස්, වැලි

26. ගෙවතු වගාවේ දි අස්වැන්න නාස්ති වන ආකාරය නොවන්නේ
   1. සතුන්ගෙන් හානි සිදුවීම.
   2. අධික වැස්ස ලැබීම.
   3. නියගය ඇති වීම
   4. නියමිත කාලයට අස්වැන්න නෙලා ගැනිම.

27. 3R සංකල්පයට අයත් කරුණක් නොවන්නේ
   1. ප්‍රතිචක්‍රකරණය
   2. ජීවානුහරණය
   3. භාවිතය අවම කිරිම.
   4. නැවත භාවිතා කිරිම.

28. රූපයේ දැක්වෙන බෝතලයේ පතුල ඉවත් කර සාදාගත් වගා බදුනේ සිටුවා ඇති කුඩලු පැලයේ අතු ඉහලට නැවෙන්න හේතුව කුමක් විය හැකි ද?



   1. හිරු එළිය ලබා ගැනිමට
   2. වාතය ලබා ගැනිමට
   3. අලංකාරයට
   4. ජලය ලබා ගැනිමට

29. ගෙවත්තේ වගා කරන පලා වර්ගයක් නොවන්නේ.
   1. ගොටුකොළ 2. කංකුං 3. තම්පලා 4. පුහුල්

30. කාබනික පොහොර යෙදිමෙන් ඇති වාසියක් වනුයේ
   1. රෝග වලට ගොදුරු වීම.
   2. විෂ රහිත ආහාර ගැනිමට හැකි විම.
   3. පෝෂණ ගුණයෙන් අඩු ආහාර ලැබීම.
   4. රසයෙන් අඩු ආහාර ලැබීම.

31. සතුන්ට හානි නොකර සතුන්ගෙන් වගාවට සිදුවන හානිය වලක්වා ගැනිමට ගෙවත්තේ රදවන උපකරණයක් වනුයේ
   1. උගුල 2. කැටපොලය 3. සුළංටකය 4. දඬුවැට

32. වගා බිමක් සැකසීමෙ දී කුණු එකතු කිරිමට යොදා ගන්නා උපකරණයකි.
   1. අලවංගුව 2. මුල්ලුව 3. උදැල්ල 4. රේක්කය

33. බෝග වගාවට අහිතකර සතෙකු වන්නේ.
   1. ඉත්තෑවා 2. සමනලයා 3. බඹරා 4. ගෙම්බා

34. හිරු එළිය අඩුවෙන් අවශ්‍ය ශාකයකි.
   1. බටු 2. දාස්පෙතියා 3. ඇන්තුරියම් 4. කෝමාරිකා

35. එළවළු එකින් එක නොගැටෙන ලෙස නොතැලෙන ලෙස තැබිමෙන් සිදුවන දෙය තෝරන්න.
   1. කුණු වීම 2. මේරීම 3. ඉදීම 4. ආරක්ෂා වීම.

36. හේනේ වගා කරන බෝගයක් නොවන්නේ.
   1. කුරහන් 2. ඉරිගු 3. මෙනේරි 4. තල්

37. අතීතයේ දී ගෙවතු වගාවේ ආරක්ෂාව සඳහා යොදා ගත් සම්ප්‍රදායික ක්‍රමයක් නොවන්නේ.
   1. වගාවන් සඳහා අළු යෙදීම.   2. පඹයන් සිටුවීම
   3. දැල් ආවරණ යෙදීම   4. වකය ගැට ගැසීම

**38. ''උණ දඩු කපන තැන උණදඩු රිකිල්ලා**
**බට දඩු කපන තැන බටදඩු රිකිල්ලා''** යන ජන කවිය ගායනය කරනු ලබන්නේ,
   1. කුරහන් කපන විට   2. පන් නෙලන විට
   3. පැල් රකින විට   4. ගොයම් කපන විට

39. බෝග වගාවේ දි මල්වලට හානි කරන සතෙකු වන්නේ
   1. කටුස්සා   2. කුරුමිණියා   3. පුරුක් පණුවා   4. බඹරා

40. රූප සටහනේ දැක්වෙන ආකාරය මුං බීජ දමා දින කීපයකට පසු බැලූ විට බීජ පැළ නොවීමට බල පෑ හේතුව කුමක්ද?




   1. ආලෝකය නොලැබීම
   2. වාතය නොලැබීම
   3. ජලය නොලැබී
   4. පොහොර නොලැබීම.

41. ඉවතලන දෙය ප්‍රතිචක්‍රිකරණය කර වගා බඳුනක් සාදාගත හැකි දෙයක් වනුයේ.
   1. ලී   2. ප්ලාස්ටික්   3. පන්   4. උණ බට

42. අතීතයේ හේන් වගාවේ යෙදුණ ගොවියා අස්වැන්න ආරක්ෂා කර ගැනීමට නොකළ දෙයක් වනුයේ,
   1. අද්දර තැලීම   2. පිරිත් පැන් ඉසීම   3. වෙඩි දැමීම   4. පටි බැඳීම

43. ''මොනවද මුත්තේ මොකද කරන්නේ'' ගීතයෙන් ගෙවතු වගාව ගැන කියවේ. එම ගීතයේ රචකයා කවුද?
   1. රෝහණ වීරසිංහ ය.   2. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි.
   3. අනුෂා නානායක්කාර ය.   4. නන්දා මාලනී ය.

44. ක්‍රමවත් ගෙවත්තක් පවත්වා ගැනිමෙන් ලැබෙන වාසියක් නොවන්නේ.
   1. ප්‍රයෝජන ගැනිමේ දි වඩා පහසු බව ඇතිවීම.
   2. ගෙවත්ත වඩා සුන්දර ස්ථානයක් වීම.
   3. සිතට සැනසිමක් ඇති විම.
   4. පස සෝදා යෑම.

45. ඖෂධ පැළෑටියක් ලෙස ගෙවත්තේ වවන ශාකය තෝරන්න.
   1. දාස්පෙතියා   2. තම්පලා   3. ඉඟුරු   4. කපුරු

46. කැලේ කපා ගිනි තබා අලුතෙන් සකස් කර ගන්නා හේන හඳුන්වන්නේ.
   1. කනතු හේන   2. වගාහේන   3. අලුත් හේන   4. නවදැලිහේන

47. දඩු කැබලි සිටුවා පැලයක් ලබා ගත නොහැකි බෝග වර්ග කුමක් ද?.
   1. බතල   2. කංකුං   3. මඤ්ඤොක්කා   4. දඹල

48. මේරීමට පෙර නෙලා ගත යුතු ඵලවළු වර්ගය තෝරන්න.

1. වට්ටක්කා　　2. බණ්ඩක්කා　　3. කැකිරි　　4. කරවිල

49. තවාන් දැමීමට සුදුසු බීජ ඇතුළත් පිළිතුර තෝරන්න.

1. මිරිස්, අලිගැටපේර, වී　　2. මිරිස්, දාස්පෙතියා, වම්බටු

3. අඹ, මිරිස්, කුඩලු

50.




A　　B　　C　　D

රූපවල දක්වා ඇති බීජ සහිත බඳුන් දින කීපයක් නිරීක්ෂණය කල විට ඉක්මනින් බීජ පැළ වී ඇති බව දක්නට ලැබෙන්නේ කුමන භාජනයේ ද?

1. A　　2. B　　3. C　　4. D

කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය කැබිතිගොල්ලෑව

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 11. වැඩ පහසු කිරීමේ මං |
|---|---|---|

සැකසුම :- ටී.එම්. ජයවීර
අ/ අඹගස්වැව අශෝක ජයන්ති වි.

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කාර්යාලය

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ගැඹුරු ළිඳකින් ජලය ඉහළට ගැනීම සඳහා භාවිතා කෙරෙන වැඩ පහසු කිරීමේ යන්ත්‍රය කුමක් ද?
   1. ජල රෝදය  2. දැති රෝදය  3. කරාමය  4. කප්පිය
2. " සෙක්කුව" භාවිත කෙරෙන්නේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?
   1. සී සෑම  2. වී (බැත) හුළං කිරීම.  3. තෙල් සිඳීම.  4. පිටි කෙටීම.
3. රූපයෙන් දැක්වෙන උපකරණය කුමක් ද?



   1. ඩැහි අඬුව  2. දඬු අඬුව
   3. බුරුමය  4. යතු කැටය
4. විදුලි පන්දමක් වඩාත් දීප්තිමත්ව දැල්වීම සඳහා වියළි කෝෂ නිවැරදිව සම්බන්ධ කළයුතු ආකාරය දැක්වෙන්නේ කුමන රූපයේ ද?

   

5. රූපවල දැක්වෙන දේවල් හා සම්බන්ධ කාර්යය අනුපිළිවෙළින් අඩංගු පිළිතුරු තෝරන්න.

  

   1. කැපීම  ඇඳීම  ලිවීම
   2. ලිවීම කැපීම  පැළඳීම
   3. කැපීම ලිවීම පැළඳීම

6. දී ඇති ආවුද අතරින් කම්බි ඇණයක් සවි කිරිමට සහ ගැලවීමට යොදාගත හැකි වඩාත්ම සුදුසු උපකරණය වන්නේ ?

1. 
2. 
3. 
4. 

7. සිසුන් කණ්ඩායමක් රූපයේ පෙන්වා ඇති පරිදි සෑදූ ඇටවුමක ඇණයේ හිස වෙතට ඇල්පෙනෙත්තක් ළංකළ විට එය ඇණයේ ඇලුණි.




01. ඇණය සාදා ඇති ද්‍රව්‍ය විය යුත්තේ

1. පිත්තල 2. ඇලුමිනියම් 3. යකඩ 4. ප්ලාස්ටික්

02. මෙම ඇටවුම කුමක් ද?

1. ජල රෝදයක් 2. චුම්බකයක් 3. අනිලමානයක් 4. බල්බයක්

8. යකඩ ඇණය වෙත අල්පෙනෙති වැඩියෙන් ම ඇදී එන්නේ පහත සඳහන් කුමන ඇටවුමේ ද?

1. 
2. 
3. 
4. 

9. පහත දැක්වෙන උපකරණ අතුරෙන් බීම බෝතල් විවෘත කිරීමට යොදා ගැනෙන්නේ කුමක් ද?.

1. 
2. 
3. 
4. 

10. බල්බය දැල්වීම සඳහා A හා B ඇණ දෙක සම්බන්ධ කිරීමට යොදා ගත හැක්කේ,




1.වාර්නිස් කොළයකි.
2.ඊයම් කොළයකි.
3.ඩිමයි කොළයකි.
4.සව් කොළයකි.

11. එදිනෙදා ජීවිතයේ චුම්බක භාවිත වන උපකරණයක් හෝ භාණ්ඩයක් නොවන්නේ

1. ශීතකරණය 2. ඇතැම් කබඩ්වල දොර
3. සමහර අත් බෑග් 4. සාමාන්‍ය පෑන

12. එසවීම පහසු කරවන ක්‍රමයක් වන්නේ

1. කප්පි 2. ලීවර 3. චක්‍රය හා අක්ෂි දණ්ඩ 4.කැස්පර් වීල්

13. කැස්පර් වීල් යොදාගත් අවස්ථාවක් නොවන්නේ

1. රෝහල් ට්‍රොලි 2. මහන මැෂිම 3. විධායක පුටු 4. බංකුව

14. ගල පහසුවෙන් පෙරළීමට දණ්ඩ අල්ලාගත යුතු වඩාත් ම සුදුසු ස්ථානය දැක්වෙන රූපය කුමක් ද?



1. 2. 3. 4.

15. අපට විදුලිය ලබාගත හැකි ක්‍රමයක් නොවන්නේ

1. ඩයිනමෝව 2. බල්බය 3. ජෙනරේටරය 4. සූර්ය කෝෂය

16. චක්‍රය හා අක්ෂි දණ්ඩට උදාහරණයක් නොවන්නේ

1.සුක්කානම 2.බුරුමය 3.ගිරය 4.ජල කරාමය

17. ''ලීවරයකට" උදාහරණයක් නොවන්නේ

1. කොස්ස 2. රේක්කය 3. උදැල්ල 4. බොලොක්කය

18. වැඩ පහසු කිරීම සඳහා යොදා ගන්න උපකරණ හා ඒවායේ කාර්යය නිවැරදිව දක්වා නැති ප්‍රකාශය කුමක් ද?.

1. ඩැහි අඬුව - යමක් තදින් අල්ලා ගැනීමට.
2. අඬු මිටිය - ඇණයක් ගැසීම හා ගැලවීමට.
3. විල් බැරෝව - යම් බරක් පහසුවෙන් ගෙන යාමට.
4. මුඩි අරිනය - මුඩියක් කැපීමට.

19. ඈතින් පිහිටි වස්තුවක් ළංකර බැලීම සඳහා යොදා ගන්නා උපකරණය වන්නේ

1. අත් කාචය 2. දුරදක්නය 3. අන්වීක්ෂය 4. මාලිමාව

20. ක්ෂුද්‍ර ජීවීන් වැනි ඉතාම කුඩා ජීවීන් බලා ගැනීම සඳහා යොදා ගන්නා උපකරණය වන්නේ

1. අන්වීක්ෂය 2. මාලිමාව 3. අත්කාචය 4. දුරදක්නය

21. ''පැඩලය'' යොදා ඇත්තේ

1. පා පැදියේ ය. 2. යතුරු පැදියේ ය. 3. කරත්තයේ ය. 4. විල්බැරෝවේය.

22. ''සකපෝරුව'' භාවිතා කරන්නේ

1. කුඹල්කරුවා 2. ධීවරයා 3. ගොවියා 4. වඩුවා

23. බිම වැටී ඇති අල්පෙනිත්තක් හෝ ඉදිකටුවක් අහුලා ගැනීමට වඩාත් සුදුසු ක්‍රමය කුමක්ද?

1. කාන්දම් කැබැල්ලක් ළං කිරිම.   2. යකඩයක් ළං කිරිම.

3. පිත්තල කැබැල්ලක් ළං කිරිම.   4. ඇලුමිනියම් කැබැල්ලක් ළං කිරිම.

24. විද්‍යුත් ශක්තිය ආලෝකය බවට පත් කරන්නේ

1. බල්බය   2. මෝටරය   3. ඩයිනමෝව   4. හීටරය

25. විද්‍යුත් ශක්තිය තාපය බවට පත් කරන්නේ

1. බල්බය   2. මෝටරය   3. ඩයිනමෝව   4. හීටරය

26. චාලක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කරන්නේ

1. බල්බය   2. මෝටරය   3. ඩයිනමෝව   4. හීටරය

27. මාලිමා යන්ත්‍රයක් භාවිතය ගැන වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න.

1. නිවැරදිව සෑම දිශාවක්ම සොයාගත හැක.
2. උතුරු දිශාව පමණක් සොයාගත හැක.
3. සතුරන් සිටින දිශාව සොයාගත හැක.
4. තමාගේ නිවස සොයාගත හැක.

28. ආලෝකය ලබා ගැනීම සඳහා යොදාගත හැකි උපකරණයක් නොවන්නේ

1. විදුලි බල්බය   2. ලන්තෑරුම   3. ලාම්පුව   4. කණාමැදිරියා

29. '' බුරුමය'' භාවිතා කරන්නේ

1. වඩුවා   2. ගොවියා   3. පෙදරේරුවා   4. ධීවරයා

30. ''මට්ටම් ලීය'' භාවිතා කරන්නේ

1. පෙදරේරුවා   2. වඩුවා   3. ගොවියා   4. ධීවරයා

31. ''ලඹය'' භාවිතා කරන්නේ

1. ධීවරයා   2. වඩුවා   3. ගොවියා   4. පෙදරේරුවා

32. '' මුල්ලුව'' භාවිතා කරනුයේ කුමන කර්මාන්තයේ ද?

1. කෘෂි   2. වඩු   3. පෙදරේරු   4. ධීවර

33. කම්බියක් තුළින් විදුලිය ගමන් කරන විට එයට සිදුවන දේ

1. කම්බිය පුපුරා යා හැක.   2. කම්බිය ඉරි තලා යා හැක.
3. කම්බිය රත්විය හැක.   4. කම්බිය හැකිලිය හැක.

34. පහත දක්වා ඇති උපකරණ වලින් කෙරෙන කාර්යය නිවැරදිව දක්වා නැති ප්‍රකාශය කුමක් ද?.

1. ඉස්කුරුප්පු නියන = ඇණයක් තද කිරීමට.
2. විල් බැරෝව = බරක් ගෙනයාම.
3. බුරුමය = ඇණයක් ගැලවීම.
4. මුඩි අරිනය = බෝතල් මුඩියක් ඇරීම.

35. පහත දක්වා ඇත්තේ විවිධ කර්මාන්තයන්හි භාවිත කරන උපකරණ කිහිපයකි.එයට නොගැළපෙන ප්‍රකාශය වනුයේ

1. කෘෂි කර්මාන්තය = දැකැත්ත, උදැල්ල, වියගහ
2. පෙදරේරු කර්මාන්තය = මේසන් හැන්ද, ලඹය, මනිස් ලෑල්ල
3. වඩු කර්මාන්තය = යතු කැටය, කියත, අතකොලුව,
4. ධීවර කර්මාන්තය = සල්ලඩය, අඩුමිටිය, මුලු මට්ටම,

36. අතීතයේ දී වැඩ පහසු කරගැනීමට භාවිත කළ උපකරණයක් නොවන්නේ කුමක්ද?

1. කුරහන් ගල 2. සෙක්කුව 3. රෙදි සෝදන මැෂිම 4. වංගෙඩිය

37. වැඩ පහසු කර ගැනීම සඳහා නූතනයේ භාවිතා කරන උපකරණයක් වන්නේ කුමක් ද?

1. වංගෙඩිය 2. කුරහන් ගල 3. සෙක්කුව 4. මහන මැෂිම

38. වර්තමානයේ දී වැඩ පහසු කිරිමේ යන්ත්‍ර නිසා මිනිසාට ලැබෙන වාසියක් නොවන්නේ කුමක් ද?

1. විදුලිය වැය නොවීම. 2. කාලය ඉතිරි වීම.
3. වැය වන මිනිස් ශ්‍රමය අඩුවීම. 4. ඉක්මනින් කාර්යය නිම වීම.

39. විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍රයක් නොවන්නේ කුමක් ද?

1. රෙදි සෝදන මැෂිම. 2. විදුලි පංකාව
3. කුරහන් ගල 4. රූපවාහිනිය.

40. නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

1. බොලොක්කයක් නොමැතිව වතුර ඇදීම පහසුය.
2. දණ්ඩක් යොදා නොගෙන අතින් ගලක් පෙරළීම පහසු ය.
3. විල්බැරෝව භාවිත නොකර ගෝනියක් පිට මත තබාගෙන යාම පහසු ය.
4. බොලොක්කයකින් වතුර ඇදීම පහසු ය.

41. ඉන්ධන යොදාගෙන ක්‍රියාකරන වාහනයක් හෝ උපකරණයක් නොවන්නේ කුමක්ද?

1. බස් රථය 2. ත්‍රීරෝද රථය 3. පරිගණකය 4.චිමිනි ලාම්පුව

42. පහත සඳහන් ද්‍රව්‍ය අතුරෙන් චුම්බකවලට ආකර්ෂණය වන ද්‍රව්‍යක් වන්නේ කුමක් ද?

1. මකන කෑල්ල 2. යකඩ කුඩු 3. සෘජුෆෝම් 4. කඩදාසි.

43. පහත සඳහන් ද්‍රව්‍ය අතුරෙන් චුම්බකවලට ආකර්ෂණය නොවන ද්‍රව්‍යක් වන්නේ කුමක් ද?

1. ඇල්පෙනෙති 2. ටින්ටෙක්ස් ඇණ 3. වීදුරු 4. යකඩ කුඩු

44. චුම්බක හැඩ කිහිපයක් තිබේ. එයට අයත් නොවන්නේ කුමක් ද?

1. තරු හැඩයේ චුම්බක 2. දණ්ඩ චුම්බක
3. රවුම් හැඩයේ චුම්බක 4. ලාඩම් හැඩයේ චුම්බක

45. පහත දැක්වෙන්නේ නූලක ගැටගසා එල්ලන ලද චුම්බකයකි.එයට තවත් චුම්බකයක් ළංකළ අවස්ථාවක් පහත දැක්වේ.පහත රූපසටහන් 02 ඇසුරෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.




1. රූපයේ දක්වා ඇත්තේ දණ්ඩ චුම්බක දෙකකි.
2. N අග්‍රයේ උතුරු දිශාව ද S අග්‍රය දකුණු දිශාව ද නිරූපණය කරයි.
3. චුම්බක දෙක ළංකර විට (S අග්‍රය සහ S අග්‍රය) ආකර්ෂණය වේ.
4. S අග්‍රය සහ S අග්‍රය ළංකර විට විකර්ෂණය වේ.

